ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"මා විසින් දේශය නාස්ති නොකරන පිණිස පවුරක් ගොඩනගා දේශය උදෙසා මා ඉදිරිපිට කඩුල්ලෙහි සිටීමට ඔවුන් අතරේ මනුෂයෙකු සෙව්මි" (එසකියෙල් 22 : 30)

76 වන වෙළුම අංක 01 (901) 2017 ජනවාරි මාසය

# මේ පැය උදෙසා දෙවියන් වහන්සේ වචනයක් ලබා දී තිබෙන සේක.

මෙය මනුෂ්‍යය ඉතිහාසයේ අතිශය ප්‍රබල පැයකි. මෙහිදී ලෝකය තුල අනතුරු ඇඟවීම් වර්ධනය වෙමින් පවතින්නේ ය. නමුත් මම තදින්ම අසා සිටින්නේ මේ පැය උදෙසා ස්වාමීන් වහන්සේට සැලස්මක් නැද්ද....? සභාවට පණිවිඩයක් නැද්ද....? මේ පැයේ දී නැවත ආත්මිකව යථා තත්වයට පත්කිරිමට සැලකිල්ලක් දක්වීමට ස්වාමීන් වහන්සේගෙන් පණිවිඩයක් නැද්ද....?එසේ පණිවිඩයක් නොමැති නම්, ඉතිහාසය තුල ප්‍රථම වතාවට ස්වර්ගීය නිහඩතාවය යටතේ විශාල වූ අර්බුධකාරි අවස්ථාවක් පැන නගින්නේ ය.

දෙවියන් වහන්සේ ජල ගැල්මෙන් ලෝකය විනාශ කිරිමට ප්‍රථම උන්වහන්සේ නෝවාගේ මුඛය පාවිච්චි කරමින් අනතුරු ඇඟවිමේ පණිවිඩය දුන්සේක. දෙවියන් වහන්සේ මිසරය විනිශ්චය කිරිමට පෙර උන්වහන්සේ මෝසෙස්ව සහ ආරෝන්ව ඵාරාවෝ වෙතට යවමින් දිව්‍යමය පණිවිඩය ඔවුන්ගේ තොල්වලින් ප්‍රකාශයට පත්කරනු ලැබුසේක. ඊශ්‍රයෙල් සහ යුදා සෙනග තීරණාත්මක අවස්ථාවලට මුහුණ දි සිටිද් දී දෙවියන් වහන්සේ, එළියා,යෙසායා,යෙරමියා වැනි අනාගතවකතෘවරුන් නැගිටුවා ඔවුන් වෙතට යැවුසේක. ඔවුන් ජිවත් වූ පැය සඳහා දෙවියන් වහන්සේ ගේ වචනය ඔවුන් තුල තැබුසේක.

(හෙබ්‍රෙව් 11 ፡ 7, නික්මයාම 5 ፡ 14, 1 රාජවලිය 17 ፡ 1) එමෙන්ම දෙවියන් වහන්සේ මේ පැය සඳහාත් පණිවිඩයක් තිබෙන සේක.

## පසුතැවිලි වීමට කැඳවනු ලබන සේක.

ඉතා වැදගත් පැයක ජීවත් වෙන අපි මනුෂ්‍යයන්ව පසුතැවිලිවීමේ කාරණා වලට පිබිදවිය යුතුය. දෙවියන් වහන්සෙගේ පිබිදීම අප වෙතට පැමිණීම අපගේ සෙනඟගේ (ජාතියේ ) මහත් වූ අවශ්‍යතාවයයි. එහි දී දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත් කාරකාම් කරමින් අයැද සිටිම් මහත්සේ ඉවහල් වන්නේය. සභාවන් මත අළුතින් පෙන්තකොස්තය පැමිණෙන පිණිස සහ දෙවියන් වහන්සේ දයාවන් උදෙසා මැදහත්වේමින් අයාචනා කල යුතුය.

අතීතයේ දී මෙය ඊශ්‍රායෙල් තුල ඉෂ්ඨ විය. වර්තමානයේ දී අප අතරේ ද එය ඉෂ්ඨ වන්නේ ය. සභාව තුල පාපයේ මුල් පැවතීම හේතුවෙන් ඕනෑම වෙලාවක ආත්මික බලය පිරිහීයාම හැගෙන්නට පුළුවන. ලොකයේ පාපිෂ්ඨ ස්වාභාවයන්වල මුල් පුද්ගලිකව කිතුණුවන්ගේ ජිවිත වල තිබිම නිසා ක්‍රම ක්‍රමයෙන් පහළට ඇද වැටෙමින් සිටිති. මනුෂ්‍යන්ගේ ක්‍රියාවන් කරුණු කොටගෙන භය නොවී ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පුර්ණව උද්යෝගීමත්ව, සැමතැනම සිටින්නාවු මනුෂ්‍යයන්ව පසුතැවිලි වීමට කැඳවීමේ පණිවිඩය දේශනා කිරිමට සුදුසුකම අවස්ථාව මෙයයි.

## පසුතැවිලි නොවන්නා වු පාපයන්

කිතුණුවන්ගෙන් මේ පැයේ දී පසුතැවිලිවීම ආරම්භ කිරිමට දෙවියන් වහන්සේ සැලසුම්කර තිබෙන සේක. කිතුණුවන් තමුන්ගේ ලෞකීක තත්වයෙන්, යාච්ඤා නොකර සිටීමේ පාපයන්, උදාසීනත්වයෙන් සහ අන්තරාද්‍රයක අලසකමින් සහ නිදිමත කමින් හැරි පශ්චත්තාප වීම අවශ්‍යව තිබේ. කිතුණුවන් තමන්ගේ ලෞකීක තත්වයන් සහ ස්ථාන පිළිබඳව සටන් වැදීම ගැන සහ සභාවේ ඔවුන්ගේ භයානක (දැඩි, තියුණු) ආරවුල්, නිකායන් අතර ඇති ඊර්ෂ්‍යාවන් ගැන පසුතැවිලි විය යුතුය. දෙවියන් වහන්සේගේ සභාවේ සෙනඟ වරද පිළිනොගැනීම සහ පසුතැවිලි නොවීම නිසා පසුබානසුළු බලපෑමක් ඇතිව සිටින වාතාවරණයක පවතින තෙක් ලෝකයේ මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගෙන් ඈතට ගමන් කරමින් සිටින්නෝ ය.

අපගේ ස්වාමීන් වහන්සේගේ ගෝලයන් සහ අතීතයේ දී සිටියාවු අනාගතවකතෘ මෙන් සහ බලයෙන් ඇවිළදේශනා කුඩුව තුල ගිගුරුම් දෙමින් දේශනා කිරීමට කාලය පැමිණ ඇත. ලවොදික සභාවේ සිටි සෙනග නින්දේ පසුවූනාක් මෙන් සිටින වර්තමාන සභාවේ සෙනග නින්දෙන් අවදිවීමට අත්‍යවශ්‍ය කාලය පැමිණ ඇත. එමෙන්ම ලෝකයට ප්‍රේමකිරීමෙන්, තමාටම ප්‍රේමකිරීමෙන් සහ ඔවුන්ගේ නොවැදගත් ක්‍රියාවලින්, ඔවුන්ගේ මුළු හදවතින්ම දෙවියන් වහන්සේ වෙතට හරි නිරහාරව හා කඳුළු සලමින්, වරද පිළිගෙන, පසුතැවිලිවී දෙවියන් වහන්සේට භාරවිය යුතුය.

කොඩිගත් සේනාවක් මෙන් සභාව බලසම්පන්න සිටින්නේ කොතනද....? (සලමොන්ගේ ගීතිකාව 6:4) ඉතා කුරිරු පාලකයෙක්වූ ස්කොට්ලන්තයේ දුෂ්ට මේරි රැජිනගේ කාලයේදී ජෝන් නොක්ස් යාච්ඤා කලාක් මෙන් ස්වාමින් වහන්සේගේ සෙනග යාච්ඤා කරන්නේ කෙසේද.....? දෙවියන් වහන්සේගේ දරුවන්, දෙවියන් වහන්සේගේ අලේපයෙන් සහ බලයෙන් පූර්ණව දේශනාකරුවන්ව දැක වර්තමානයේදී දෙවියන් වහන්සේගේ සතුරන් මේ ආකාරයෙන් පවසන්නේ කොතැනද.....?"නමුත් ඔවුහු ඔවුන් සොයා නොදැක යසෝන් සහ සමහර සහෝදරයන්ද නුවර මුලැදැනින් ළගට ඇදගෙන ගොස් ලෝකය පෙරළුවාවූ මොවුහු මෙහිත් ඇවිත්ව සිටිති." (ක්‍රියා 17 ፡ 6)

අද දවසේදී මෙම කාරණා අප තුල සැබැවි නැත්තේ ඇයි? දෙවියන් වහන්සේගේ සෙනග අසාර්ථකව සිටින නිසාත්, ඔවුන්ගේ ජිවිත සහ හදවත් විශාල ලෙස පාපය සමග බැදී පවතින නිසාත්ය. සමහරවිට එහිදී පාපය විශාල ලෙස නොතිබුනත් නොහික්මුණු ලෙස හෝ අප්‍රසන්න ලෙස පවතිනවා ඇත. බොහෝදෙනා ඉතා කුඩා සොරකම් කිරීමේ පාපය පමණක් කරනවා විය හැකිය.

(තෝරාගනු ලැබු ලිපියක් ඇසුරෙනි)

එයින් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා අප තුල තිබු ප්‍රේමය උද්යෝගී රහිත වී සහ නැතිවී සිටින්නාවූ ආත්ම වෙනුවෙන් තිබු ප්‍රේමය උද්යෝග රහිත වී සහ නැති වී සිටින්නාවූ ආත්ම වෙනුවෙන් තිබු දැඩි ආශාව අහිමිවී යන්නේය. එමෙන්ම ස්වාමින් වහන්සේගේ හඬ නැසෙන පිණිස අපගේ ආත්මික කන් නොපැහැදිලි වී සහ ලෝකයේ අස්වැන්න නෙළා ගැනීමේ දර්ශනය දැකීමට නොහැකි වන ලෙස ආත්මික ඇස් අඳුරුවී ඇත. උන්වහන්ස්ගේ සේවය කිරීමට නොහැකිවන ලෙස අපගේ දැත් බෙලහිනවා සහ අංශභාගිතත්වයට පත් වී වැරදි සොයමින් අනිත් අයව විවේචනය කරන්නාවූ කෙනෙකුගේ තත්වයට පත්වන්නෝය. (සාලමොන්ගේ ගීතිකාව 2 ፡ 15, දේශනාකාරයා 10 ፡ 1, 1 කොරින්ති 5 ፡ 6, ගලාති 5 ፡ 9)

## "එබැවින් ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් ඇඳිනගන්නහුය" ( මතෙව් 7 : 20 )

සාලමොන්ගේ ගීතිකාව තුල ස්වර්ගීය මනමාලයා විසින් මනමාලිය වන සභාව තුල අඩංගු විය යුතු අනර්ඝ වු කාරණා රූපාලංකාරයෙක් මෙසේ පවසන්නේ ය. **"මිදිවැල් නරක් කරන සිවලුන් එනම්, කුඩා සිවලුන් අල්ලා දියල්ලා. මක්නිසාද අපේ මිදිවැල්වල මල් පිපී තිබේ."** (සලමොන්ගේ ගීතිකාව 2 ፡ 15) අපි මහත් වු අස්වැන්නක් දැකීමට නම්, කුඩා සිවලුන් අල්ලා ඉවත්කර දැමිය යුතුය. එම කුඩා සිවලුන් අහිංසක සහ වරදක් නැති බව දැකිය හැකිය. නමුත් උන් ඵලදාව විනාශ කරන්නෝය. කුඩා පාපයන් වලට ලෝකය සමග මංශය සහ සාතන් සමග ඒකඟතාවයට පැමිණීමෙන් අපට ප්‍රයෝජනවත්ව තිබෙන බොහෝ දේ විනාශ වී යන්නෝය. අපගේ ස්වාමීන් වහන්සේගේ මිදිවත්තෙන් ඒවා සම්පූර්ණයෙන්ම ඉවත්කර දැමිය යුතුය. අපි ඒ සියළුම දේවල් පිළිබඳව පසුතැවිලි වී ඒවා අත්හැර දැමිය යුතුය. ඒවිට දෙවියන් වහන්සේට අපව සෝදිසි කිරිමට ඉඩ හැරීමෙන් අපගේ ජිවිත නැමැති ආත්මික ගෘහය කොපමණ පුදුමාකාර ලෙස සහ කොපමණ සියුම් ලෙස ආත්මායාණන් වහන්සේ විසින් පවිත්‍ර කරනු ලබනවා දැයි අපි දැනගනු ලබන්නෙමුව. ( ගීතාවලිය 139 ፡ 23 - 24, 1 ලේකම් 28 ፡ 9 )

අප අතරින් සමහර අය ඔවුන්ගේ ජිවිත වල දෙවියන් වහන්සේට ප්‍රථම ස්ථානය ලබා දී නොමැති බව අපි දකින්නෙමු. නමුත් තමන්ගේම ආශාවලට ලෞකික සැප සම්පත් වලට, සහ මිතුරන්ගේ හෝ නැදෑයන්ගේ ඉල්ලීම්වලට යටත්ව සිටින අතර දෙවියන් වහන්සේට දෙනු ලබන්නේ දෙවෙනි ස්ථානයයි. අප අතරින් තවත් සමහර අය කෙලින්ම පාපයට සම්බන්ධ වී සිටින නිසා දෙවියන් වහන්සේව දන ගැනීමට විරුද්ධව කැරලිකාරයන්ව සිටිත්. එමෙන්ම

2 පිටුවෙන්

" ...නුබලාගේ සිත් අද දවසේ මෙන් අපේ දෙවිවු ස්වාමින් වහන්සේ වෙත සම්පුර්ණව තිබේවයි කීවේ ය." ( 1 රාජාවලිය 8 : 61 )

# මේ පැය උදෙසා....

1 පිටුවෙන්

උන්වහන්සේගේ කැඳවීමට ඇහුම්කන් දෙන්නේ නැතිව ඔවුන්ගේ ජීවිත වලින් උන්වහන්සේගේ සේවය අතහැර දමා ඇත.

ඊලඟට තමන්ගේ ජීවිතය කුරුසියේ ඇණනොගසා පිළිකුල් සහගත පාපයන් සම්පූර්ණ කරනු ලබනවා ඇත. තමාගේම කැමැත්ත තමාවම සතුටු කර ගැනීම, තමාවම මහිමයට පත්කරගැනීම, තමා ගැනම විශ්වාසය තැබීම, ආත්මාර්ථකාමී ලෙස ආදරය (සෙනෙහස) දැක්වීම ආදී ආශාවලින්, අභිප්‍රායන් වලින්, තෝරා ගැනීම් පිරී සිටින නිසා ශුද්ධාත්මයාණන් වහන්සේට වේදනා දෙමින් මේ පැයේ දී ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ සේනාව කැඳවන්නා වූ කාරණයට නුසුදුසු ලෙස ප්‍රතිචාරය දක්වමින් සිටිති.

අප අතරින් සමහර අය කෝප වීම, මුහුණෙන් අමනාපය ප්‍රකාශ කිරීම නොරිස්සන සුලු ස්වාභාවය ඇතිව සිටීම තුල ඉතා පහසුවෙන් (නිදහසේ) තම කැමැත්ත මත රැඳී සිටින බව ප්‍රකාශ වේ. අප අතරේ සිටින එබඳු අය සමාව නොදීම සහ ඊර්ෂ්‍යාව තුලද සිටිති. (යාකොබ් 3 ඃ 14 - 18) තවත් අය රහසිගතව සහ සීමාවක් නැතිව පාපය තුල සිටිති. නමුත් ඔවුන්ට දෙවියන් වහන්සේගෙන් සැඟවීමට නුපුළුවන. (ගීතාවලිය 19 ඃ 12 - 13) ඕපාදූප කථා කිරීම්, අනිත් අය ගැන අගුණකීම, කේලාම් කීම, වැනි දේ එහි ඇති තවත් භයානක පාප වන්නේ ය. (යාකොබ් 3 ඃ 2 - 12  2 කොරින්ති 12 ඃ 20) මේ සියළුම දේ දෙවියන් වහන්සේ අප්‍රසන්න කරන කාරණ වේ (හිතෝපදේශ 6 ඃ 16 - 19) ඔවුන් දෙවියන් වහන්සෙගේ අශීර්වාදයේ දොරටු වසාගෙන ඇත. අපගේ නිවසේ, අපගේ ජනසමාජය, අපගේ ජාතිය සහ ලෝකය වෙනුවෙන් අපගේ යාච්ඤා වලට දෙවියන් වහන්සේ ලබා දෙන පිළිතුරු සඳහා ඔවුන් බාධාවක් වී සිටින්නේ ය.

**"බලව ගළවන්ට බැරි ලෙස ස්වාමීන් වහන්සේගේ අත කොට වෙලාවක් නැසෙන ලෙස උන්වහන්සේගේ කන බිහිරි වෙලාවක් නැත. නමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන් වහන්සේ අතරේ වෙන්වීමක් කෙළේය. උන්වහන්සේ නොඅසනා ලෙස නුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ නුඹලාගෙන් සැඟෙව්වේය. මක්නිසාද නුඹලාගේ අත් ලෙයින් ද, නුඹලාගේ ඇඟිලි අපරාධකමෙන් ද කිලුටු වී තිබේ. නුඹලාගේ තොල් බොරු කීවේය. නුඹලාගේ දිව දුෂ්ඨකම් නික්මවන්නේය. ධර්මිෂ්ඨකමින් හඬගසන කෙනෙක්වත්, සැබෑකමෙන් නඩුකියන කෙනෙක්වත් නැත. ඔවුහු හිස්කම කෙරෙහි විශ්වාසය තබා බොරු කියති. ඔවුහු නපුර පිළිසිඳ ගෙන අයුක්තිය වදති"** (යෙසායා 59 ඃ 1  - 4)

අපට දෙවියන් වහන්සේව අවශ්‍යව තිබෙන සේක. අස්වාභිවික අතිශය ප්‍රබල පිබිදීමක් අපට අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේගේ කරුණාව අපව බැහැදැකීමෙන් හැර මේ වර්තමාන අන්තරා සහිත පැයෙන් මිදීමට අපට වෙනත් කිසිදු ප්‍රඥාවකින් පුළුවන්කමක් නොමැත.සිදුවෙන්නට ආසන්නව තිබෙන්නා වු විපත්තිය ගැන දෙවියන් වහන්සේගේ වචනයේ අපට අනතුරු අඟවන සේක.**"ස්වාමීන් වහන්සේ විසින් ක්‍රියා කිරීමට සුදුසු කාලය දන්ය. මක්නිසාද ඔවුහු ඔබගේ ව්‍යවස්ථාව කඩ කළෝය."** (ගීතාවලිය 119:126) **"...ස්වාමීන් වහන්ස,අවුරුදු අතරතුරේ ඔබගේ ක්‍රියාකිරීම ප්‍රාණවත්කළ මැනව..."** (හබක්කුක් 3:2)

ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීමේ පැය මෙය බව මම විශ්වාස කරමි. ඒ නිසා දෙවියන් වහන්සේගේ සෙනග වශයෙන් දෙවියන් වහන්සේගේ මහත් වු අරමුණු ප්‍රකාශවන්නාවු උන්වහන්සේගේ කරුණාව මත මුලු ආත්මයෙන්ම රැදි සිටීම අපගේ ප්‍රතිචාරය විය යුතු ය.එබැවින් දෙවියන් වහන්සේගේ බැහැදැකීමෙන් අපගේ හදවත් ප්‍රබෝධමත් කිරීම අපට ඉතාම වැදගත්ව තිබේ. අපගේ හදවත්, අපගේ සභාවන්, අපගේ ජන සමාජය, අපගේ ජාතිය සහ ලෝකය වෙත පිබිදීම ලබා ගැනීම උදෙසා සෑම උත්සහයක්ම දැරිය යුතුය. මේ පැය තුල අපට දෙවියන් වහන්සේගේ වචනයේ සදහන් උන්වහන්සේගේ කරුණාවේ විශේෂිත වු පොරොන්දු සොයා ගැනීමට නොහැකි වන්නේ වුවත්, එහි සම්පූර්ණ වු දිව්‍යමය විනිශ්චයේ පණිවිඩය එවා තිබෙන සේක. එමෙන්ම ඇදහිල්ල සහ පසුතැවිලිවීම තුල දෙවියන් වහන්සේගේ මුහුණ සෙවීමට තමන්ගේ ජිවිත යටහත් කරන්නා වු අයව ගළවා ගැනීමටත්, මුදුගැනිමටත් පොරොන්දු වී තිබෙන සේක.

නිනිවයේ ගළවා ගැනීම ගැන සිතන්න. අතීත දවස්වලදී එය අන්‍යජාතින් ජිවත් වු, දුෂ්ඨකමින් පිරි තිබුණා වු නගරයකි. අනාගත වක්තෘවරයෙක් වු යෝනාව දෙවියන් වහන්සේගේ පණිවිඩය ඇතිව නිනිවයට යවනු ලැබුසේක.**"යෝනා නුවරට ඇතුල්වෙන්ට පටන්ගෙන දවසක ගමන් යමින් තව සතළිස් දවසකින් නිනිවය හෙළා දමනු ලැබේ යැයි කියා ප්‍රකාශ කළේය."** (යෝනා 3 ඃ 4) එහි දයාවේ පොරොන්දුවක් තිබුණේ නැත. එමනිසා නිනිවයේ රජතුමා සහ සෙනග මෙලෙස හේතු දක්වනනට ඇත. ''දෙවියන් වහන්සේට අප සම්බන්ධව කරුණු සහගත සිතුිවිල්ලක් නොතිබෙන්නේ නම් උන්වහන්සේ අපට මේ ආකාරයෙන් අනතුරු ඇඟවීමක් එවන්නේ නැත.'' ඒ නිසා ඔවුන් ගෝනි රෙදි ඇඳගෙන, අලුවලහිඳ ගනිමින්, නිරාහාරව පසුතැවිලි වෙමින් බලවත් ලෙස දෙවියන් වහන්සේට මොරගැසුවෝය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ විනිශ්චයේ නියෝගය අහෝසිකර කරුණාවෙන් ක්‍රියා කළ සේක. ( යෝනා 3 ඃ වන පරිච්චේදය කියවන්න. ) දෙවියන් වහන්සේ අන්‍යජාතික නිනිවයේ සෙනගට සියළු කරුණාවන් දක්වමින් ක්‍රියාකල සේක් නම්, උන්වහන්සේගේම සෙනග පසුතැවිලිවී හැරී එන විට ඊට වඩා වැඩියෙන් උන්වහන්සේ ක්‍රියා නොකරන සේක්ද......?

අපගේ ලෞකිකත්වයෙන්, ආත්මාර්ථකාමීත්වයෙන්, නැවත හැරි පසුතැවිලි වි ස්වාමින් වහන්සේගේ මුහුණ සොයන විට දෙවියන් වහන්සේ පැමිණ ධර්මිශ්ඨකමේ වර්ෂාව අපවෙත වගුරවන සේක. ( හෙෂෙයා 10 ඃ 12 )

## දෙවියන් වහන්සේ සමග එකතු කරනු ලැබීමෙන් පසු

දෙවියන් වහන්සේගේ ශුද්ධකමෙන් පිරී සිටියා වූ මනුෂ්‍යයන් බලවත් ජාතීන්ට පරාජය නොවී සිටීම පිළිබඳව ඉතිහාසයේ විස්තරාත්මක ව වාර්තාකර ඇත. ලෝකයේ ප්‍රඥාවෙන් බලද්දී ඔවුන් මෝඩ, දුර්වල වැද ගැම්මට නැති පුද්ගලයන් වේ. නමුත් දෙවියන් වහන්සේ සමග එකතු කරනු ලැබීමෙන් පසුය.පසු ඔවුන් බලවත් පරාජය කල නොහැකි  විරුද්ධවාදීන්ට නිහඩ කල නොහැකි සහ ජයග්‍රාහී සෙනගක් බවට පත් වූ වෝය. ඔවුන් තිබෙන්නාවූ කාලය සහ ඉතිහාසය ගමන් කළා වූ දිශානතිය වෙනස්කර සහ ජාතීන්ගේ මුහුණුට නව අද්දැකීම් ගෙන දෙනු ලබන්නෝය. ශක්කතියක් නැති ඔවුන් විශ්මය ජනක ක්‍රියාවක් ඉටුකරනු ලබති. අපෝස්තුළු පවුල්, මාටින් ලූතර්, ජෝන් වෙස්ලි එබඳු පුද්ගලයන් කිහිප දෙනෙකි. එවැනි පුද්ගලයන් අවසන් වී නොමැති නිසා දෙවියන් වහන්සේ ස්තුතිවේවා. මෙය එලෙසින් ක්‍රියා කිරීමට ඇති අපගේ අවස්ථාවයි. ( කාලයයි )

වර්තමානයේ කිතුනුවන් දෙවියන් වහන්සේ උදෙසා මුළු ශක්තියෙන් ගමන් කිරීමෙන් වැලකි වැදගැම්මකට නැති (නිරර්ථක දේවල) යේදී සිටිනවානම් සිදුවන්නේ කුමක්ද.....?. අපි ස්වාමින් වහන්සේට කීකරුව දිව රෑ දෙකෙහි යාච්ඤා කරන්නේ නම් අපගේ සතුරන්ට ඔවුන්ගේ ක්‍රියාවල ප්‍රතිපලය ලබාදීමට හැකි වෙන්නේය. (ලූක් 18 ඃ 7 - 8) දෙවියන් වහන්සේ සමග සහ එකිනෙක සමග කාරණා හරිගස්වා ගන්නේ නම් සැකයක් නොමැතිව දෙවියන් වහන්සේගේ බැහැදැකීම රැගෙන ඒමට හැකිවේ. අපට අන්තරා සහිතව සහ නපුරුව තිබෙන සියළු කාරණා ගැන යමක් සිදුවන පිණිස අද දවසේ මම යාච්ඤා කරමි.මෙය නොකඩවා නිරාහාරව කඳුළු සලමින් යච්ඤාකිරීමට කාලයයි. අද දවසේදීම එය ආරම්භ කරන්න.ඔබ එසේ කරන්නේ නම් බලවත් වූ දෙවියන් වහන්සේගේ බැහැදැකීම සියළුම අවස්ථාවලදී අත්දකිනවා ඇත.

## දෙවියන් වහන්සේට අළුතින් කිකරුවීමෙන් පිබිදිම ආරම්භ වන්නේ ය.

**"නුඹලා මගේ පනත් ලෙස හැසිර මගේ ආඥාවන් රක්ෂාකරමින් ඒවා පවත්වනාහු නම්, මම නියම සෘතුවෙහි නුඹලාගේ වර්ෂාවල් දෙන්නෙමි. දේශයේ එහි වර්ධනයක් දෙන්නීය. කෙතේ ගස්ද ඒවායේ ඵල දෙන්නේ ය. නුඹලාගේ ගොයම් මඩින කාලය මුදිකා ඵල නෙළන කාලය දක්වා පවත්වන්නේය, වපුරන කාලය දක්වා පවත්නේය. නුබලා සෑහෙන්ට කෑම කා නුබලාගේ දේශයේ හි සුරක්ෂිතව සිටින්නාහුය. නුබළා නිදාගන්න කල කිසිවෙක් නුඹලා භය නොගන්වන ලෙස දේශයෙහි සමාදානය දෙන්නෙමි. දේශයෙන් චණ්ඩ මෘගයන් පහකරන්නෙමි. කඩුවද නුඹලාගේ දේශය මැදින් නොයන්නේ ය. නුඹලා නුඹලාගේ සතුරන් එළවන්නාහු ය. ඔවුහු නුඹලා ඉදිරියෙහි කඩුවෙන් වැටෝන්නෝය. නුඹලාගෙන් පස්දෙනෙක්, සියදෙනෙක්ද, නුඹළාගෙන් සියදෙනෙක්, දසදහසක්ද එළවනවා ඇත. එසේ නුඹලාගේ සතුරෝ නුඹලා හමුයෙහි කඩුවෙන් වැටෝන්නෝය." (ලෙවී කථාව 26:3-8)**

# දෙවියන් වහන්සේට කැපවීම.

**(චාර්ල්ස් ස්පර්ජන්ගේ දේශනයකින් උපුටා ගන්නා ලදි.)**

**"ආලුම් අනුභව අවුරුදු වයසට පැමිණිකල ස්වාමීන් වහන්සේ ආලුහම්ට පෙනී මම සර්ව පරාක්‍රම වූ දෙවියන් වහන්සේය. මා ඉදිරියේහි හැසිරෙමින් සම්පූර්ණ වෙයන්න."** (උත්පත්ති 17 ඃ 1)

යම් මනුෂ්‍යයෙක් ස්වාමීන් වහන්සේගේ සේවයට සම්පුර්ණයෙන්ම කැපවීම සදහා දෙවියන් වහන්සේගේ මහිමය, සරවබලධරිත්වය සහ සියළු දේ උදෙසා උන්වහන්සේ සෑහෙන බව ප්‍රේථමයෙන්ම    අවබෝධ කරගත යුතුය. සහෝදරයෙනි, අපි දෙවියන් වහන්සේට සේවය කිරීමේ දී උන්වහන්සේ සියළු කාරණාවලින් අපව පුර්ණ කරන අතර උන්වහන්සේගේ බලය සහ අශිර්වාදය අපට ලබාදෙනසේක. අපි දෙවියන් වහන්සේ ගැන සිතන්නේ කුඩාවට නම් එහි ප්‍රතිඵලය වන්නේ අපි උන්වහන්සේට කීකරුවන්නේ සහ උන්වහන්සේව විශ්වාස කරන්නේද සුළු වශයෙනි. නමුත් අපි මහත් ලෙස දෙවියන් වහන්සේගේ මහිමය අවබෝධ කර ගැනීමට නම් අපි නොකඩවා (නොසෙල් වී) උන්වහන්සේ මත විශ්වාසය තැබීමට ඉගෙන ගත යුතුය. පාපය මුලිකවම, දෙවියන් වහන්සේ බලන ආකාරයෙන් දැකීමට ඇති හැකියාව බොහෝ සෙයින් බෙලහීන කරනු ලැබීම ආරම්භ කරන්නේය.

තමන්ගේ ආත්මයෙන් සියළුම දේ උදෙසා සෑහෙන්නාවූ දෙවියන් වහන්සේට ආත්මය පවරා තිබෙන බව මනුෂ්‍යයෙකුට හැගෙන විට තම ගැන ඇති මාන්නය තුල සතුටුවීම ලූහුබැදයම දෙස බලාසිටින්නේ නැත.මනුෂ්‍යයන්ගේ සෙල්ලක්කාර නිශ්ඵල විනෝදවීම් සමග සතුටුවීම තුල ඔහු ගමන්කරන්නේද නැත.දෙවියන් වහන්සේ මා තුලින් ප්‍රකාශවීමට බලාසිටින බැවින් මගේ ප්‍රීතිය සහ සැනසිල්ලට අවශ්‍ය සියළුම දේ සදහා උන්වහන්සේ සෑහෙන සේක කියා එබදු පුද්ගලයා පවසනවා ඇත. එමනිසා මගේ දෙවියන් වහන්සේ තුල මම බොහෝ සෙයින් ප්‍රීතිමත් වන්නෙමි. අනිත් අය බිදුනාවූ කටාරම් වලින් වතුර බොන අතර මම මා තුල වාසය කරන්නාවූ, උතුරා යන්නාවූ උල්පත සහ සම්පූර්ණ කරන්නා වන ස්වාමින් වහන්සේ කෙරෙහි තෘප්තිමත් වන්නෙමි.

ප්‍රේමවන්තයෙනි, අපගේ ස්වාමින් වහන්සේගේ නාමය දරාසිටීම කෝපමණ යෝග්‍යව තිබෙනවද.....? කෙසේ හෝ ඔබ උන්වහන්සේගේ නාමය තුල වාසය කිරීමට එක මොහොතක්වත් තෝරාගන්නේ නම්, මා ලබන්නාවූ ආශිර්වාදයේ දොරටු ඔබටත් විවෘත වෙනවා ඇත. උත්පත්ති 17 ඃ වන පරිච්ජේදයේදී දෙවියන් වහන්සේ ආබ්‍රම්ට හදුන්වා දෙන උන්වහන්සේගේ නාමය එල්ෂඩායි වන සේක. එල්ෂඩා් යනුවෙන් අදහස් කරන්නේ ඉතාමත් ම ප්‍රබල, ශක්තිමත්, අසීමිත බලයෙන් යුක්ත වූ ජෝහොවා වෙතට පැමිණීම යි. අපි බලවත් වූ උන්වහන්සේ වෙතට යොමුවන්නේ නම් අප දූර්වල යැයි අපි පවසන්නේ කෙසේද.....? ඊලගට

6 පිටුවට

" ...නුඹලා  ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්නට නොහැකිය" ( මතෙව් 5 ඃ 14 )

# ශුද්ධකමට පිබිදීමේ ක්‍රියාමාර්ග

**"නුඹලා කැඳ වු තැනන් වහන්සේ ශුද්ධ ව සිටින්නේ මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේ දී ශුද්ධ ව සිටපල්ලා" (1 පේතෘස් 1 ៖ 15)**

කිස්තුස් වහන්සේ මෙන් ශුද්ධ ව සිටින විට එම පුද්ගලයා තුල උන්වහන්සේගේ ස්වාභාවය, උන්වහන්සේගේ ආදර්ශය සනාථ කරන සේක. යේසුස් වහන්සේගේ ස්වරූපයට සුදුසු ලෙස ඔහුව පිළියෙළ කරන සේක. ඊළගට ඔහු කිස්තුස් වහන්සේ මෙන් ශුද්ධ ව සිටිමින් ආත්මයාණන් වහන්සේගේන් පුර්ණවිය. (එපිස 5 ៖ 18) යම් කෙනෙක් කිස්තුස් වහන්සේගේ සිත (මනස) ඇතිව ජීවත්වන විට, උන්වහන්සේ තුල තිබු අලේපයත් ඇතිව සිටින්නෝය. යේසුස් වහන්සේ තුල සිටියාවූ එම ආත්මයාණන් වහන්සේම ඔහු තුලත් වාසය කරමින් ක්‍රියා කරනසේක. ආත්මයාණන් වහන්සේගේ ජීවිතය, ඇදහිල්ල, සත්‍යතාවය, නිදහස, ශක්තිය, ශුද්ධ වූ ප්‍රීතිය තැබීමට පිළිගන්න සේක. ඒ තුලින් ඉතා වේගයෙන් අපව ප්‍රිබෝධමත් කරනසේක. අපව පවිත්‍ර කරන සේක. (2 තෙසලෝනික 2 ៖ 13 , 1 ප්‍රේතෘස් 1 ៖ 2) අපගේ ආරාධනයෙන් උන්වහන්සේගේ ක්‍රියාව අප තුල ඉටු කරන සේක. උන්වහන්සේ ක්‍රියා නොකර අප තුල වාසය කරන්නේවත් , උන්වහන්සේ අප තුල වාසය නොකර ක්‍රියා කරන්නේවත් නොමැත (2 තිමෝති 1 ៖ 14) සංගීතයෙන් සිතක් ආකර්ෂණය කරගන්නක් මෙන් වෙහෙසෙන්නේ නැතිව බලපෑමක් ඇතිකල නොහැකිය. එමනිසා අපතුලට පැමිණ අප සමග වාසය කරමින් උන්වහන්සේගේ සම්බන්ධතාවයෙන් අපව පුර්ණ කරන සේක. එමෙන්ම උන්වහන්සේගේ බලය පැතිරීයාම කරුණු කොටගෙන අපව සම්පුර්ණයෙන්ම වෙනස් කරනු ලබනවා ඇත. දෙවියන් වහන්සේ අපව සදාචාරයට නම්මා ගැනීමට අපගේ හැගීම් වලට බලපෑමක් ඇතිකිරීම සහ තර්කාණුකුලව කරුණු ගෙනහැර දැක්වීමෙන් පමණක් සිදුනොකරන සේක. නමුත් වැළැක්විය නොහැකි උන්වහන්සේගේ දිව්‍යමය හස්තයේ ස්පර්ශ සහා ජයග්‍රහනයට අත්‍යවශ්‍යය උන්වහන්සේගේම ශක්තිය අවබෝධ කර ගැනීමට තදින් අවධාරණය කරනසේක. එපමණක් නොව අතිශය භයානක (බලාපොරොත්තු සුන්ව) තත්වයන්ට ඔරොත්තු දී සිටීමේ ශක්තියක් ඉගෙන ගැනීමෙන් ලෞකික ප්‍රඥාවෙන් ලබාගත නොහැකි දැනුමක් ලබා ගැනීමටත් අපගේ අවිශ්වාසයෙන් වෙන්ව සිටීමටත් හැකියාව ලැබෙන පිණිස උන්වහන්සේගේ ජීවනයෙන් සහ පවිත්‍රකමෙන් අපව පුර්ණ කරන සේක.

අපි ක්‍රිස්තුස් වහන්සේ මෙන් විය යුතු අතර තවද උන්වහන්සේ වහන්සේව අධ්‍යනය කල යුතුය. අපගේ ම උත්සාහ කිරීම කරුණු කොට ගෙන පමණක් සහ තවදුරටත් අපගේම විශ්වාසය සහ ප්‍රේමය කරණු කොටගෙන සාමාන්‍ය ශක්තියෙන් වෑයම් කිරීමෙන් පමණක් අපට අපගේ ජීවිත වලට ශුද්ධකම ළගා කරගත නොහැකිය. කිසිවෙකුට බලහත්කාරයෙන් මේ සඳහා පෙළඹවීමට නොහැකිය. ශුද්ධව ජීවත්වීමට මානුෂ්‍යයා උත්සාහ දරන නමුත් ඔවුන් අසාර්ථක වන්නෝය. එක එල්ලේ ම තමන්ගේ ක්‍රියාවලියෙන් උත්සාහ කිරීම කරුණු කොට ගෙන තම ජීවිත වලට ශුද්ධකම ළගා කර ගැනීමටත් ඔවුන්ට නුපුළුවන. ස්වාමීන් වහන්සේගේ තේජසට සහ උන්වහන්සේ මෙන් තේජසින් තේජසට වෙනස් වන තෙක් වඩා ඕනෑකමින් බලා සිටිය යුතුය. (2 කොරින්නි 3 ៖ 18) තමන්ගේ සෙනෙහෙවන්ත මිතුරන් උදෙසා ඔවුන් ශුද්ධකම තුළ පැවතිය යුතුය. යේසුස් වහන්සේ සමග සමීප සම්බන්ධතාවයෙන් පමණක් අපට උන්වහන්සේ මෙන්වීමට ළගා විය හැකිය.

යම් කෙනෙක් ශුද්ධකමට පැමිණීමට නම් ඔහු තමාගේ ජීවිතය දේව වචනය අධ්‍යනය කිරීමට යොමු කරමින් බයිබලයේ සෑම පිටුවකම එළිදරව් කර තිබෙන හිරුගේ ආලෝකය තුල මෙන් තෘප්තිමත් විය යුතුය. සත්‍යතාවය තුළින් අප පවිත්‍රකරනු ලබන සේක. (යොහාන් 17 ៖ 17) ආලෝකයේ දරුවන් මෙන් වඩා සම්පූර්ණ වීමට අපගේ ආත්ම (ජීවිත) නිරතුරුවම මෙම ආලෝකයට විවෘත කරමු. සාතන්ට විරුද්ධ වීම සඳහා දිව්‍යමය සත්‍යතාවය වේගවත් සහ බලවත්ව තිබෙන සේක. අපගේ මාර්ගයේ සිටින්නා වූ දහස් ගණන් සතුරන්ව විනාශ කර දැමීමට ආත්මයාණන් වහන්සේ කඩුව තියුණුව තිබෙන සේක. ඒය රතු මුහුද දෙබෑ කළාවු, අමලෙක්වරුන් ව පරාජය කළාවූ, කාන්තාරයේදී පර්වතයෙන් වතුර නික්මෙන්ට සැලැස්වූවාවු මෝසෙස්ගේ සැරයැටිය මෙන් වන සේක. ඇතුලාන්තයේ සිටින්නාවූ සතුරාගේ හෝ පිටත සිටින්නාවූ සතුරා කුමක් වුවත් එම සතුරාට විරුද්ධව සිටගෙන පරාජය නොවී මෙම වචනයෙන් ජය ගත හැකිද......? මෝසෙස්ගේ අතේ සැර යැටිය තිබෙද්දී සිදුවූයේ කුමක්ද......? ඒය සාමාන්‍ය ලී දණ්ඩකි. එසේ වුවත් රතු මුහුද එයින් දෙබෑ කරනු ලැබිය. පිත්තල සර්පයාව ලී දණ්ඩක තබා තිබිය දී සිදු වූයේ කුමක්ද......? ගිනි සර්පයන් දෂ්ඨ කරන ලද දහස් ගණන් දෙනා ලී දණ්ඩේ සිටි පිත්තල සර්පයා දෙස බැලු විට සුවය ලැබුවෝය. මේ සියලූ දේවල් සිදුවූයේ ඇයි......? ලී දණ්ඩ (මෝසෙස්ගේ සැරයැටිය) සහ පිත්තල කැබැල්ල සර්වබලධාරීත්වය සමඟ සම්බන්ධ වීම නිසා ස්වර්ගීය බලය විදුලිය මෙන් ඒ මතට පැමිණි සේක. ඒමනිසා බයිබලයේ ඇති සියල්ල තුලින් අපව සුවපත් කිරීම, අපව උද්යෝගීමත් කිරීම, ශක්තිමත් කිරීම, සනසනු ලැබීම, සහ පවිත්‍ර කරනු ලැබීම සිදු කරනසේක.

ශුද්ධකමට පැමිණීමට අවශ්‍යනම් සටන් කළ යුතුය. ඇදහිල්ලේ යහපත සටනේ සටන් කිරීම සහ යහපත් යුද්ධයෙහි යුද්ධ කිරීම අවශ්‍යව තිබේ. ඒය කල යුතු වන්නේ මාංශික යුද්ධායුධ වලින් නොවේ. (1 තිමෝති 1 ៖ 18-19, 6 ៖ 12, 2 කොරින්ති 10 ៖ 4) මෙම සටන කළ යුතු වන්නේ දෙවියන් වහන්සේ ඉදිරියේ දණින් වැටී සිහියෙන් යුක්තව පවතින යාච්ඤාවෙන් බලාසිටීම තුලිනි. (1 ප්‍රේතෘස් 4 ៖ 7) දෙවියන් වහන්සේ දී තිබෙන්නා වු ආත්මික යුද්ධායුධ පැළඳගෙන, ස්වාමීන් වහන්සේ තුලද, උන් වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද බලවත් වී අධිපතිකම්වලටත්, පරාක්‍රමධාරීන්ටත් විරුද්ධව පොර බැදිය යුතුය. (එපිස 6 ៖ 10 - 18) තමන්ගේ බලයෙන් මෙම සටනේදී ශක්තිමත්ව සිටිය නොහැකිය. (දේශනාකාරයා 9 ៖ 11) මනුෂ්‍යයා දුර්වල නිසා සටනේදීත් බෙලහීනව සිටිති. ඔවුන්ට බලවත්වූ ජයග්‍රහණයක් ලැබී නැත. නමුත් යේසුස් වහන්සේගේ ජයග්‍රහණය අප තුල පවතින පිණිස උන් වහන්සේ අපට ප්‍රේමකල සේක. එයින් අපේක්ෂිත ප්‍රතිඵල අපේ සැනසීම වෙනුවෙන් එළිදරව් පොතේ සභා හතටම යවනු ලැබූ ලිපි වල ප්‍රකාශ කර තිබෙන සේක.**"ආත්මයාණන් වහන්සේ සභාවලට කියනදේ කන් ඇත්තේ අසාවා. ජයගන්නට නම් දෙවියන් වහන්සේගේ පාරාදීසයෙ හි තිබෙන ජීවන වෘක්ෂයෙන් කන්ට දෙන්නෙමි"** (එළිදරව් 2 ៖ 7) (එළිදරව් 2 ៖ 11,17,26, 3 ៖ 5, 3 ៖ 12, 3 ៖ 21) එසේ වුවත් සාතන්ගේ විරුද්ධවාදී කම තුල ලෝකයේ අපගේ ක්‍රියාමාර්ග සහ පොරබැදීම වෙනුවෙන් අපට උපකාර කිරීමට දේවදූතයන්ව සේවක ආත්මයන් ලෙස අප උදෙසා ලබා දී තිබෙනසේක. (හෙබ්‍රෙව් 1 ៖ 14) එමෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයක් ලබාදී තිබුණු සේක. (එපීස 1 ៖ 13 - 14 )

ශුද්ධකමට පැමිණෙන පිණිස බලා සිටිය යුතුය. **"නමුත් නඹ සියළු කාර්ණාවල දී සිහි ඇතිව සිටපන්න......"** (2 තිමෝති 4 ៖ 5) **අවදිව සිටපල්ලා, ඇදහිල්ලේ ස්ථිරව සිටපල්ලා, පුරුෂයන් මෙන් සිටපල්ලා, ශක්තිමත් වෙයල්ලා."** (1 කොරින්නි 16 ៖ 13) දරුවන් රාත්‍රී කාලයේ නින්දේ සිටිනවා හෝ අන්ධකාරය තුළ පැටලෙනවා විය හැකිය. නමුත් අපි අනපේක්ෂිත පැමිණෙන පරික්ෂා වලට හසු නොවන පිණිස මුළු දවසේම සිහිබුද්ධියෙන් යුතුව සිටිමින් සාතන් උපක්‍රමශීලීව යොදන කපටිකමේඋගුල් වලට හසු නොවී සහ මේ අපඩාරී (හිතුවක්කාරි) ලෝකයට ආකර්ෂණය නොවී සිටිය යුතුය.**"නග්ගව ඇවිද තමාගේ ලැජ්ජාව මනුෂ්‍යයන්ට නොපෙනෙන පිණිස අවදිව සිට තමාගේ වස්ත්‍ර ආරක්ෂා කරගන්නා ආශිර්වාද ලද්දෙක්ය."** (එළිදරව් 16 ៖ 15) අවදිව සිටීම තුළ මෙලෙසින් පවතිමු. **"ඇදහිල්ලේ යහපත් සටනෙන් සටන්කොට සදාකාල ජීවනය අල්ලාගනීන්න. ඊට නුඹ කැඳවනු ලැබ බොහෝ සාක්ෂි කාරයන් ඉදිරියෙහි යහපත් ප්‍රකාශනය කර සිටියෙහිය."** (1 තිමෝති 6 ៖ 12) අපි ලැජ්ජාවට පත් නොවන පිණිස යේසුස් වහන්සේගේ ගුණාංග දරාගෙන සිටිමු. වේගයෙන් සහ

හොරටියස් බෝනර්
(1808 - 1889) විසිනි.

ඉවසිමෙන් අපි මෙම දිවීම දුවමු. **"එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා සියළු බරද පහසුවෙන් අප හසුකරන පාපයද අහක දමා ඇදහිල්ලේ කතෘවරයද, සම්පූර්ණ කරන්නාද වු යේසුස් වහන්සේ දෙසම බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු." (හෙබ්‍රෙව් 12 ៖ 1) "නමුත් දෙවියන් වහන්සේගේ මනුෂ්‍යය නුඹ වනාහී මේවායින් පලාගොස් ධර්මිෂ්ඨකමද, භක්තිවන්තකමද, ඇදහිල්ලද, ප්‍රේමයද, ස්ථිරකමද, මොලොක් ගුණයද පස්සේ පල යන්න."** (1 තිමෝති 6 ៖ 11) අපගේ ස්වාමී වු යේසුස් වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ පැමිණීම බලා සිටීම මත අපගේ දැස් රදවා තබා ගනිමු. (තීතස් 2 ៖ 11 - 13

ශුද්ධකමට පැමිණීමට නම් යේසුස් වහන්සේගේ ශරීරයේ සාමාජිකයෙක් ලෙස සහ ශුද්ධාත්මයාණන් වහන්සේ සහභාගිත්වය තුළ පවතින කෙනෙක් ලෙස තමාට පැවරී තිබෙන වගකීම ඔවුන් අවබෝධ කරගත යුතුය. වගකීමේ හැගීම්වලින් දුර්වලව සිට අපට මඟපෙන්වා තිබෙන මාර්ගයේ ගමන් කරන්නේ නැතිව ශුද්ධාත්මයාණන් වහන්සේට දුක් දෙමින් මෙම අදහස පරිපූර්ණ (සම්පූර්ණ) කරගැනීමට සමීප විය නොහැකිය. **"දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේට දුක් නොදෙල්ලා. මක්නිසාද උන්වහන්සේ තල නුඹලා මිදිමේ දවසට මුද්‍රාකරනු ලැබූවහුය."** (එපීස 4 ៖ 30) යේසුස් වහන්සේගේ ලේ කරුණු කොටගෙන අපව පවිත්‍රකර තිබෙනසේක. (හෙබ්‍රෙව් 13 ៖ 12) එපමණක් නොව අපගේ ජීවිත පුද්ගලිකව එම අයිතිවාසිකම් (උරුමයේ) පූර්ණත්වය දරා සිටිය හැකි භාජන විය යුතුය. සෑම ශුද්ධවන්තයෙකුටම ඒ වගකීම පැවරී තිබේ. ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙනද අපට පවිත්‍ර විය හැකිය.(1 කොරින්නි 6 ៖ 11) ආත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන ගෙන යනු ලබන කෙනෙක් විය යුතුය. (ගලාති 5 ៖ 18) අපගේ ශරීරය ශුද්ධාත්මයාණන් වහන්සේගේ මාළිගාව වනසේක. (1 කොරින්නි 6 ៖ 19) ආත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන හැසිරිය යුතුය. (ගලාති 5 ៖ 16) ආත්මයාණන් වහන්සේ කරුණු කොට ගෙන කථා කළ යුතුය. (1 කොරින්නි 12 ៖ 3 ) ආත්මයාණාන් වහන්සේ කරුණු කොට ගෙන ජීවත් විය යුතුය. (ගලාති 5 ៖ 25) ශුද්ධාත්මයන් වහන්සේ සමඟ සහභාගිකමව ඇතිව සිටින්න.( 2 කොරින්නි 13 ៖ 14 )

පාපයේ රැවටිලිකාරකම යටතේ පවතින නිරර්ථක දේ කිරීම කිතුණුවන් නොකළ යුතුය. ආත්මයාණන් වහන්සේගේ ප්‍රේමයේ පූර්ණත්වය ලෙස දැක්විය යුතු අතර සියළු නපුරු, සිතුවිලි, ප්‍රායෝගකාරක, කුහකම, දුෂ්ඨ වචන, අත්හැරදමා දවස්පතා නිදහස් වෙමින් මේ කිසිවක් පිළිබඳව ණයව නොසිටිය යුතුය. (රෝම 13 ៖ 8 ) අලසකමේ ආත්මයක් තුල නිසරු (නිශ්ප්‍රයෝජන) ලෙස වාසය නොකර තම ජීවිතයේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵල හටගන්නට ඉඩහරිමින් මනුෂ්‍යයාගේ හදවත්වල දිව්‍යමය ඵල ගොඩ නඟන පොළොවේ පස්මත ස්වර්ගීය ඵල හටගැනීමට සලස්වන අපගේ ඵලවලින් අපගේ ඇතුලාන්ත ප්‍රකාශ කරන සහ අප තුල සිටින්නා වූ තැනැන්වහන්සේගේ තේජස ප්‍රකාශ වන ජීවිතයක් ගත කරන කෙනෙක් වෙන්න.**"නමුත් ආත්මයාණන් වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධ වූ අවස්ථාවක් නැත."** ( ගලාති 5 ៖ 22 - 23 )

දැන් තිබෙන්නාවූ මේ නපුරු ලෝකයෙන් අපව ගලවාගන්නා පිණිස යේසුස් වහන්සේ තමන් වහන්සේගේ ජීවිතය පුජා කල සේක.**"උන්වහන්සේ දැන් තිබෙන නපුරු ලෝකයෙන් අප ගළවන පිණිස අපගේ පියවූ දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස අපේ පව් නිසා තමන්ව පාවාදුන්සේක."** (ගලාති 1 ៖ 4) ශුද්ධවන්තයන් ලෙස පරණ පාපිෂ්ට දේවලින් සහ මනුෂ්‍යකාරයෙ නොසැලකිලිමත් ලෙස

6 පිටුවට

"......ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමීන් වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුවයන්ටත් උත්සහා කරපල්ලා"(හෙබ්‍රෙව් 12 ៖ 14)

# කැපවුණු ජීවිතය

**ජේ. ස්ටුවර්ට් හෝල්ඩන් විසිනි**

**"එහෙත් මා සමඟ ගිය මාගේ සහෝදරයෝ සෙනඟගේ සිත් දියව යන්ට සැලැස්සුවෝය.නමුත් මම සම්පූර්ණ ලෙස මාගේ දෙවි වූ ස්වාමින් වහන්සේ අනුව ගියෙමි." (යොෂුවා 14 ඃ 8)**

අපගේ වර්තමාන කිතුණු ජීවිතයේ වගකීම් වලට මුළු ශක්තිය යොදා කැපවීමෙන් බැදී සිට විශාල ලෙස අභිමිවෙයැයි හැගෙන දේවල් නැවත ප්‍රකෘති තත්වයට පත්කර ගැනීම මහත් අවශ්‍යතාවයක් ව තිබේ. මනුෂ්‍යයන් පොදු කාර්‍යයන් තුල ක්‍රිස්තුස් වහන්සේ ගැළවුම්කරුවාණන් ලෙස අවබෝධ කරගැනීම ගැන සෑහීමට පත් වීමට එකඟව සිටිති. නමුත් ඉතා වැදගත් අරමුණු සහ තදින් උත්සාහදැරීම සමඟ කටයුතු කිරීම සීමාකරගෙන ඇති බව එත්තු ගන්නේ නැත. එහිදී බොහෝ දෙනා ක්‍රිස්තුස් වහන්සේව අවබෝධ කරගෙන උන්වහන්සේව විශ්වාස කරන්නේ ගැළවීම ලබාගැනීමට, උන්වහන්සේගේ දීමනා ලබා ගැනීමට, ගණින ලද උන්වහන්සේගේ අනුගාමිකයන්වීමට වන්නේය. නමුත් ඔවුන් උන්වහන්සේගේ ස්වභාවය තුල සම්පූර්ණයෙන්ම පවතින්නේ නැත. එහිදී ක්‍රිස්තුස් වහන්සේට ඔවුන්ගේ ජීවිත රාජධානිය ආක්‍රමණය කිරීමට ඉඩහරින්නේ නැත. මේ වන විටත් ඔවුන්ගේ ගැළවුම්කරුවාණන් නිසා උන්වහන්සේ ඔවුන්ගේ ස්වාධිපත්‍යයෙන් ඈත්ව පවතිමින් මෙතැන් පටන් ඔවුන්ගේ දුර්වලකම් සහ නිශ්චලතාවයන් ගැන සාක්ෂිකරුවා වනසේක. යම් කෙනෙක් උන්වහන්සේව සම්පූර්ණයෙන්ම අනුගමනය කරන්නේ නම් පමණක් ඒ අයට මේ ලෝකයේ ජීවිතය උන්වහන්සේව අනුකරණය කිරීම මත ගමන් කිරීමට පිළියෙල කරනසේක.

උද්යෝගීමත් නොවූ ඒවැනි ජීවිත සමග කාලෙබ්ගේ සාක්ෂිය සංසන්දනය කරබලන්න. එම සාක්ෂිය ආත්මාර්ථකාමී එකක් නොවේ. ඒ නිසා ඒහි ඉලක්ක කරතිබෙන සැලැස්මේ ප්‍රකාශනය ආපසු හැරෙන්නේ නැත. **".....නමුත් මම සම්පූර්ණ ලෙස මාගේ දෙව්වූ ස්වාමීන් වහන්සේ අනුව ගියෙමි."** (යොෂුවා 14 ඃ 8) යනුවෙන් ප්‍රකාශ කරන මනුෂ්‍යයාගේ සාක්ෂිය නොසලකා ඔහුගේ ජීවිතය කරුණු කොටගෙන ප්‍රකාශ වන්නාවූ දෙවියන් වහන්සේගේ ස්වාභාවයන්වල ප්‍රමාණය මැනිය නොහැකිය. එමෙන්ම ඔහු මනුෂ්‍ය ඉදිරියේදීත් දොස් රහිතව ජීවත් වන්නේය. එසේ ජීවත් වන්නා වූ පුද්ගලයා ස්වාමීන් වහන්සේව අනුගමනය කරමින් උන්වහන්සේගේ ආලෝකය තුල දකින්නාවූ දකින්නාවූ බාදක ඉවත්කරනු ලබන්නේ ය. ඒ නිසා ඔහු ආලෝකය තුල වර්ධනයවීම සමඟ ඔහුගේ කැපවීමද වර්ධනය වන්නේ ය. එවැනි මනුෂ්‍යයා සාමාන්‍යයෙන් වෙනස්ව පෙනෙන්නේය. ඔහු කරුණාවන්තව කැපවීමක් කරන්නේ නැතිව සෙනඟ අතරේ ප්‍රසිද්ධ වන්නේ නැත. කෙසේ හෝ සෑමවිටම එකම අරමුණක් සම්පූර්ණ කිරීමට තම ශක්තිය මත රැදී සිටිමේ උපක්‍රමය තුල යෙදී සිටින නිසා ලෝකයේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේට භය නැතිව තමන්ගේ රූප නමස්කාරවලට ගොදුරු වී සිටිති. නමුත් දේවභය ඇති පුද්ගලයා ඉවසාදරා සිටීමේ රහස ඉගෙනගෙන අදෘශ්‍යමාන දෙවියන් වහන්සේව දකින්නෝය. ඔහු පැමිණෙන්නා වූ දර්ශනය ග්‍රහනය කරගනිමින් ඔහුගේ හදවත තුල ඒය පවිත්‍රව රඳවා තබා ගනිති. ඔහු මුළුමනින්ම ස්වාමීන් වහන්සේව අනුගමනය කරන නිසා ඔහු ස්වාමීන් වහන්සේව දකිමින් නිසැකවම වර්ධනය කරගනු ලබන්නේ ය. ඒ අනුව ඔහුගේ හදවතේ ඔහුගේ මාර්ගය පැහැදිලි ව ගොඩනැගී තිබේ.

අපි ස්වාමින් වහන්සේගේ මාර්ගය දකිනවිට ප්‍රීතියෙන් ඒතුල ගමන් කිරීමට අපගේ ජීවිත පිළියෙල කරගත යුතුය. ඒ උදෙසා වැය කිරිමට සිදුවන ඕනෑම දෙයක් වැය කරද්දී ජීවිතයේ ව්‍යාකූලත්වය පහවයන්නේ ය. අප වටා පවතින්නාවූ සියළුම චෝදනාවල හඬ නොසලකා සැමවිටම පැහැදිලි අවංක මාර්ගයේ පියනගන්න. එය කුරුසයේ මාර්ගයයි.

## කැපවීමේ නිශ්චිත ප්‍රතිඵලය

මනුෂ්‍යයෙක් සම්පූර්ණයෙන්ම ස්වාමීන් වහන්සේව අනුගමනය කරන විට ඔහුගේ ජීවිතය තුල ඔහුගේ කැපවීමේ ප්‍රතිඵලය දකින්නට ලැබීම වැලැක්විය නොහැකිය. ඔවුන් දෙස බැලීමෙන් එය පහසුවෙන්ම අවබෝධ කරගත හැකිය. තමාටම වහල්ව සිටීමෙන් මිදීමට පැමිණ ඇතිබව දැකිය හැකි ප්‍රථම කාරණයයි. ජයග්‍රහණයේ අත්දැකීම අපි අවබෝධ කරගැනීම කරුණු කොටගෙන දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවට යටත් වන තෙක් සැබෑ නිදහසේ ප්‍රීතිය භුක්ති විඳින්නේ නැත. අපගේ ජීවිතවල සියළුම අංශ සඳහා මෙය සත්‍යව තිබේ. තමාවම සතුටු කර ගැනීමට වහල් ව සිටි කාලය අවසන් වේ. මනුෂ්‍යයෙක් තමන්ගේ කැමැත්ත පමණක් කරමින් සිටින්නේ නම් කිසිවිටෙක දෙවියන් වහන්සේ වෙතට යොමුවන්නේ නැත. ඔහුගේ ජීවිතයේ ඔහුම ශක්තිමත් ලෙස විලංගු දමාගෙන ඇති බව ඉක්මනින් සොයා ගත හැකිය. තමාගේම ජීවිතයේ පවතින දම්වැල් බිඳ දැමීමට ඔහුට සදාචාරාත්මක හැකියාවක් ද නොමැත.

සියළුම වැයකිරීම් කීකරුකම ශක්තිමත් කරන අතර සදාචාරය වර්ධනය සඳහා නියත වශයෙන්ම කීකරුකම සහ සටන් වැදීම අවශ්‍ය වේ. සියලූම අකීකරුකම් අපගේ හදවත් තුල කරන්නාවූ ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාවේ සේවයට බාද්‍ර ඇතිකරන්නේය. යම් කෙනෙක් දැනගෙන අකීකරුකමට ඉඩහැර තිබීම, නුසුදුසු පුරුදු වල නොකඩවා නිරතවීම, වැරදි සම්බන්ධතාවයන් පවත්වා ගෙන යාමත්, සෝදිසි නොකර නිදහසේ පාපයේ ගැලී සිටීමත්, පිළිබඳව හෘදයසාක්ෂියෙන් සෝදිසි කිරීමට පටන් ගන්න. එමෙන්ම සඳහන් කළාවූ එබඳු කාරණා ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාවේ සේවයට බාධා ඇති කරන්නේය. අපගේ අභ්‍යන්තර ආත්මික තත්වය සහ අපගේ සදාචාරය හොඳින් පවත්වාගෙන මුළු හදවතින්ම ස්වාමීන් වහන්සේව අනුගමනය කිරීම උදෙසා කාලෙබ් අපට ආදර්ශයක් වන්නේය.

ඊළඟට යම් මනුෂ්‍යයෙක් සම්පූර්ණයෙන්ම ස්වාමීන් වහන්සේව අනුගමනය කිරීම තුළ ඔහුගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ මෙන් වන්නේය. මෙහිදී සිතුවිලිවල ස්වාභාවය සහ චරිත ගුණාංග සම්පූර්ණයෙන්ම වෙනස් වීමේ රහස විවෘත වීමයි. උන්වහන්සේගේ ආඥා වලට විශ්වාසවන්ත වීමේ පුරුදු පවිත්‍ර වී ගංගාවක් මෙන් ගලායාම වර්ධනය වී මානුෂ්‍යයාගේ ජීවිතයේ සියලූ අංශ නමැති පස සාරවත් කරන්නේය. උන්වහන්සේගේ උසස් වූ අභිප්‍රායන් සහ උන්වහන්සේගේ පවිත්‍රකම කරුණු කොටගෙන අපගේ නොවටිනා ස්වාභාවයන් උත්කෘෂ්ඨ තත්වයට පත් කරනු ලබන සේක. අපගේ අසම්පූර්ණ වූ බලය උන්වහන්සේ ගේ දීමනාවන් කරුණු කොටගෙන ශක්තිමත් (බලවත්) කරන සේක. උන් වහන්සේගේ සහභාගීත්වය කරණුකොටගෙන අපගේ බෙලහීනවූ උත්සාහයන් ඵලදායී තත්ත්වයට පත් කරනසේක. උන්වහන්සේ පාලන බලය අත්පත්කරගැනීමට උත්සාහ නොදරන රජතුමාණෝ ය. එසේ වුවත් උන්වහන්සේව අනුගමනය කරන්නා වූ අයට සැකයක් නැතිව ජයග්‍රහණයට පමුණුවන සේක.

එපමණක් නොව ස්වාමීන් වහන්සේව අනුගමනය කරන්නාවූ කරන්නා වූ අයට පමණක් ආත්මික උරුමය හිමිව තිබෙන්නේ ය.

කාලෙබ්ගේ විශ්වාසවන්තකම නිසා හෙබ්‍රොන් ඔහුට පොරොන්දු වී තිබුණ සේක. දෙවියන් වහන්සේගේ පොරොන්දු යටතේ අපේ හෙබ්‍රොන් නගරත් පවතින්නේය. ක්‍රිස්තුස් වහන්සේ තුල අපට හැකි උරුමය සෝදිසි කර තේරුම් ගත නොහැකි තරම් අනර්ඝවුත්, කරුණාවේ බහුලත්වයෙන් යුතුවත්, ජීවිතයේ සියළුම කාරණාවලට සම්බන්ධව යහපත් ලෙසත් තිබෙන සේක. නමුත් අනිවාර්යයෙන්ම ඒවා අපට අත්දැකීමට ලැබෙන්නේ අපි උන්වහන්සේව සම්පූර්ණ ලෙසම අනුගමනය කරනවා නම් පමණක් වේ. අපගේ ජීවිතවල කිස්තුස් වහන්සේගේ ආධිපත්‍යයට අභියෝග කරන්නා වූ යම් දෙයක් පැවතීමට ඉඩහරින්නේ නම් අපගේ ජීවිත නිසරු බවට පත්වන්නේය. අපි සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ වනවිට සියළුදේම අපගේ වන්නේය.අළුත් සටනක් සමගම එවැනි සියළුම ආත්මික උරුමයන් අපට ගෙන්එනු ලබන්නේ ය. ඊශ්‍රායෙල් සෙනග කානන් දේශයට ඇතුල් වී ගෝත්‍ර අතරේ උරුමය බෙදා දෙනවිටදීත් ආනාක්වරු එහි ජීවත්වුවෝය.හෙබ්‍රොන් නගරය කාලෙබ්ට දී තිබෙන බව ඔහු දැන සිටියත් එහි සිටි ආනාක්වරුන්ව පරාජය කර එළවා දැමීම. ඔහු කල යුතු විය. එමෙන්ම අපිත් එලෙසම කල යුතුව තිබේ. ආත්මික ජීවිතයේ සෑම අළුත් පියවරක් තුල සටන්කර අත්පත්කර ගැනීමක් පවතින්නේය. සියළුම අළුත් ආශිර්වා ද හිමිකරගැනීම සටන් භූමිය තුලින් පැමිණෙන නමුත් සටන් කරන්නේ අපි තනියම නොවේ.අප සිටින්නා වු ස්ථානයෙන්, තත්වයෙන් ඉවත් කිරීමට සතුරාට නැවත නැවත අවශ්‍යව තිබේ. හෙබ්‍රොන් දෙවියන් වහන්සේ අපට දී තිබෙන වු දායාදයකි. අපි එම උරුමය හිමිකර ගැනීමට උද්යෝගිමත් කටයුතු කරනවා නම්, කාලෙබ් තම උරුමය හිමිකරගත්තාක් මෙන් අපිත් අපගේ උරුමය හිමි කරගන්නෙමු. ස්වාමීන් වහන්සේ අපව බලවත් කරන සේක. ශක්තියෙන් ශක්තියට ගෙනඑනසේක. අපි සටනේ වැඩ කටයුතු අතපසු නොකරන්නේ නම් පමණක් ආශිර්වාදය අතපසු කරගන්නේ නැත. කිස්තුස් යෙසුස් වහන්සේ, උන්වහන්සේව සම්පූර්ණයෙන්ම අනුගමනය කරන්නා වූ අය සමග උන්වහන්සේගේ ජයග්‍රහණයේ බෙදාගන්නාසේක. නමුත් අපගේ ජීවිතවල පහර කෑමෙන් හෝ වැටීම් වලින් ඇතිවන තැලීම් රහිතව නොවේ.

කිස්තුස් වහන්සේගේ බලෙන් අල්ලා නොගන්නා වු ස්වආධිපත්‍යයය රැදී පවතින බව අවධානය යොමු කල යුතු තවත් එක් අංශයකි. උන්වහන්සේගේ එම ආධිපත්‍යය කරුණු කොටගෙන නිශ්චිතවම සහ පැහැදිලිවම සේවය සඳහා කැඳවා තිබෙනසේක. ස්වාමීන් වහන්සේව සම්පූර්ණයෙන්ම අනුගමනය කිරීමෙන් අදහස් කරන්නේ සෑම ඇදහිලිවන්තයෙකුටම ලබාදී තිබෙන්නා වූ ප්‍රීතිය හිමිකරගෙන ලෝකය තුළ උන්වහන්සේගේ සේවය කිරීමට වරප්‍රසාදය හිමිකරගැනීමයි. සමහර සේවාවනුත් එයින් හඟවා දෙන්නේය. තවත් අදහසක් නම් පාපයේ අතරමංවී ගැළවීම අහිමිව සිටින්නා වූ අයව උන්වහන්සේගේ නිවසට රැගෙන ඒමයි. එමෙන්ම යේසුස් වහන්සේගේ මුදාගැනීමේ පූජාව මනුෂ්‍යයන් වෙතට ගෙන යාමට පුළුවන් වන පිණිස තමන්ගේ ජීවිත කැපකිරීම් කරුණු කොටගෙන ආශිර්වාදයක් වීමයි. මේ ජීවිතය පරිපූර්ණ සතුට සහ සැකයක් නැති සමාදානය ඇතිව තිබේ.''මා අනුව එන්න.....'' කියා යේසුස් වහන්සේ පැවසීමෙන් අපට තෝරා ගැනීමට ඉඩ ලබා දී තිබෙන සේක. ස්වර්ගීය හෙබ්‍රොන් අපගේ වන විට ජීවිතයේ සියළු සටන් අවසන් වන අතර ස්වාමීන් වහන්සේව සම්පූර්ණ ලෙස අනුගමනය කළා වූ බොහෝ කාලෙබ්ලා අතරේ අපි සදකාල ප්‍රීතිය හිමිකර ගන්නෙමු.

**ස්වාමීනි, උදය වේලෙහි ඔබ මාගේ හඬ අසන සේක.........."(ගීතාවලිය 5 : 3)**

# සේවය සඳහා වෙන්කරගත් සේක

**"ස්වාමීන් වහන්සේගේ මණ්ඩපයේ මෙහෙය කිරීමටත්, සභාවට සේවය කරන පිණිසත් ඔවුන් ඉදිරියේ සිටීමටත්, නුඹලා තමන්වහන්සේ ළඟට පමුණුවන ලෙස ඊශ්‍රායෙල්ගෙ දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් සභාවෙන් නුඹලා වෙන්කරගත් එකක්, උන්වහන්සේ නුඹ සහ නුඹ සමඟ ලෙවීගේ පුත්‍රයන් වන නුඹේ සියළු සහෝදරයන්ට ළංකරගත් එකක් නුඹලාට මදිද.......?"** (ගණන් කථාව 16 ඃ 9 - 10)

වෙන්කර ගැනීමේ අදහස තුල සත්‍යයතාවයෙන් වෙන්කල නොහැකි බව සහ කිතුණු ජීවිතයේ වර්ධනය අඩංගු වී තිබේ. (යොහාන් 17 ඃ16 - 19) සමහර අවස්ථාවල දී ප්‍රමාණයට වඩා දැඩි මතයක සිටීම අවශ්‍ය නොවේ. මක්නිසාද එය එක් අංශයකින් බැලීමක් පමණි. වෙන් කරගෙන තිබෙන්නේ අමාරු කාරණා උදෙසා යැයි සිතීමට තරුණ කිතුණුවන් හසුව සිටිති. මක්නිසාද වෙන්කර ගැනීම කරුණු කොටගෙන බලයෙන් පූර්ණවීම වඩා වැඩි වන්නේ කෙසේදැයි ඔවුන් දකින්නේ නැත. (රෝම 12 ඃ 1-2) මෙහි ඇති දීප්තිය සහ අලංකාරය පිළිබඳව ටිකක් කල්පනා කිරීමට ඉඩ හරිමු.

සැබෑ වෙන්කර ගැනීමේ දී අප අත්හැර පැමිණිය යුත්තේ මොනවාගේ කාරණාදැයි යේසුස් වහන්සේ අපි කැඳවන විට ප්‍රකාශ කර නැත. (මතෙව් 4 ඃ 19 - 20) වෙන්කරගැනීම තුල, හුවමාරුකර ගැනීමක් නැතිව,සාමාන කල නොහැකි වඩා හොදව තිබෙන්නේ මොනවගේ කාරණාවන්ද....? (මාර්ක් 10 ඃ 29-30) එය වන්දිගෙවීමක් ලෙස ප්‍රකාශ කිරීම අපහසුය. මක්නිසාද පාවුල්තුමා මෙසේ පවසා තිබේ. **එසේ ය, මාගේ ස්වාමී වූ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ ඇඳින ගැනීමේ උතුම්කම නිසා සියල්ල අලාභයයි සලකමි. උන්වහන්සේ නිසා සියළුදේ මට නැති වී ගියා පමණක් නොව ඒවා කුණු යයි සලකමි..... "** (පිලිප්පි 3 ඃ 8) (කොරින්ති 3 ඃ 21-23 දක්වාත් කියවන්න.)

ප්‍රථමයෙන් සහ ප්‍රධාන වශයෙන් දෙවියන් වහන්සේ අපව උන්වහන්සේ වෙතට වෙන් කරගෙන තිබෙනසේක. (ගණන් කථාව 6 ඃ 1 - 5) උන් වහන්සේට අවශ්‍යවන්නේ අපි මෙහකරුවන් වීම පමණක් නොව අපි උන්වහන්සේගේ මිතුරන් වීම වනසේක.(යොහාන් 15 ඃ 15) එමෙන්ම උන්වහන්සේ තෘප්තිමත් සහ අනර්ඝ මිත්‍රත්වයක් නිර්මාණය කරන සේක. අපව උන්වහන්සේ වෙතට ළංකර ගැනීමට යේසුස් වහන්සේට අවශ්‍යව තිබෙන සේක. අපට දෙවියන් වහන්සේ වෙතට ළංව සිටින්නාවු සෙනඟක් විය හැකිය.
**"උන්වහන්සේ ස්වකීය සෙනගගේ අඟ එසවූසේක. ස්වකීය සියළු ශුද්ධවන්තයන්ට, එනම්, තමන්ට ළංව සිටින සෙනඟක් වන ඊශ්‍රායෙල් පුත්‍රයන්ට ප්‍රශංසා හේතුවක් නැගූසේක. ස්වාමීන්ට ප්‍රශංසා කරව්."** (ගීතාවලිය 148 ඃ 14) අපට දී තිබෙන්නේ උරුමයෙන් කොටසක් නොවේ. උන්වහන්සේ මෙසේ පවසා තිබෙන සේක."**නුඹලා මට ශුද්ධව සිටපල්ලා. මක්නිසාද ස්වාමීන් වහන්සේ වන මම ශුද්ධය. මාගේ සෙනග වන පිණිස මනුෂ්‍ය ජාතීන් අතරෙන් නුඹලා වෙන්කර ගතිමි." (ලෙවී කථාව 20 ඃ 26)** "**මක්නිසාද ස්වාමීන් වහන්සේ තමන්ටම යාකොබ්ද, තමන්ගේ විශේෂ වස්තුව කොට ඊශ්‍රායෙල් ද තෝරාගත් සේක."** (ගීතාවලිය 135 ඃ 4) **"මක්නිසාද ස්වාමී වු දෙවියන් වහන්ස...., ඔබ අපේ පියවරුන් මිසරයෙන් ගෙනා විට ඔබගේ මෙහෙ කරු වු මෝසෙස් ලවා කථා කෙරෙවු ප්‍රකාරයට ඔබට උරුමයක් කොට ඔබම පොළොවේ සියළු මනුෂ්‍ය වර්ගයන් අතරේන් ඔවුන් වෙන්කරගත් සේකැයි කීවේය."** (1 රාජාවලිය 8 ඃ 53)

නාසරීයෙක් ලෙස ස්වාමීන් වහන්සේට කැපවී සිටීම සුළුකාරණයක් ද .....? **"ඔහු කැපව සිටින සියළු දවස්වල ඔහු ස්වාමීන් වහන්සේට ශුද්ධය."** (ගණන් කථාව 6 ඃ 8) නාසරීයෙක් ලෙස කැපවන පුද්ගලයාගේ හිස මත තිබෙන වගකීමට පොළොවේ කිසිදු ඔටුන්නක් සමාන කල හැකි ද .....? **"ඔහු තමගේ පියා නමුත්, මව් නමුත්, සහෝදරයා නමුත්, සහෝදරී නමුත්, මැරුණු කල ඔවුන් නිසා අපවිත්‍ර නොවිය යුතුය. මක්නිසාද ඔහුගේ දෙවියන් වහන්සේට කැපව සිටීමේ භාරය ඔහුගේ හිස පිට තිබේ."** (ගණන් කථාව 6 ඃ 7)

ලෝකයේ අය දන සිටින්නාවු මනුෂ්‍යයන්ගේ මිත්‍රත්වයට වඩා බොහෝ ප්‍රීතියෙන් පූර්ණ මිත්‍රත්වයකට අපව වෙන්කරගෙන තිබෙන සේක.

**"එසේනම් මා ඊශ්‍රායෙල් සේනාවට දුන් තලෙන්ත සියය ගැන අපි මක්කරමුදැයි දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයාගෙන් ඇසුවේය. දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයාද, ඊට වඩා ඔබට දෙන්ට ස්වාමීන් වහන්සේට පුළුවනැයි කීවේය."**(ලේකම් 25 ඃ 9) දේශයේ මනුෂයන් වෙතින් ස්වාමින් වහන්සේගේ ව්‍යවස්ථාව වෙතට අපව වෙන්කරගෙන තිබෙන සේක. (නෙහෙමියා 10 ඃ 28 - 29) එමෙන්ම පාපයේ නැති වී සිටියා වූ අපව සහෝදරයන් මෙන් පිළිගෙන තිබෙන සේක. (මාර්ක් 10 ඃ 30) නිදහස් සම්බන්දතාවය තුලින් වුවත් ප්‍රේමය, සතුට, සිනහව වෙතට ගෙනැවිත් තිබෙන සේක. මෙය සමාජයේ අනිත් මනුෂ්‍යයන් කරන්නාවූ දේවලට වඩා බොහෝ සෙයින් වැඩි දෙයක් නොවේද ......? අපි මෙය උරුමකරගැනීමට සුදානම් නැතිනම් අපේ හෘදය සාක්ෂිය හිස්ය. අපි දෙවියන් වහන්සේට වෙන්කරගැනීමට ඉඩහැර නැත. (මතෙව් 6 ඃ 24 යාකොබ් 4 ඃ 4) දෙවියන් වහන්සේගේ වැඩය ඉටුකිරීමට අපව වෙන්කර ගෙන ඇත.**"ඔවුන් ස්වාමින් වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන්කල ශුද්ධාත්මයාණන් වහන්සේ කථාකොට ම විසින් බාර්ණබස්ද, සවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලා යයි කීසේක."**(ක්‍රියා 13 ඃ 2) විවිධාකාරයෙන් වුවත් සැම මනුෂ්‍යයෙකුටම පැවරී තිබෙන කාර්ය්‍යයක් ඇත. (මාරක් 13 ඃ 34)

දුබලකම සහ විඩාවට පත්ව සිටීම වෙන්කරගනු ලැබූවාවු ජීවිතයේ කොටසක් නොවේ. අවාසනාවන්ත කිසිවක් එහි නැත. **"කුමක් හෙයින්ද මා අයිතිවූ, මා සේවය කරන්නාවූ, දෙවියන් වහන්සේගේ දුතයෙක් මේ රාත්‍රීයේ මා ළඟ සිට පවුල් භය නොවන්න. නුඹ කායිසර් ඉදිරියෙහි සිටින්ට ඕනෑය. බලව, නුඹ සමග නැවෙන් යන්නාවූ සියල්ලන්ද දෙවියන් වහන්සේ නුඹට දුන්සේකැයි කීවේය."** (ක්‍රියා 27 ඃ 23 - 24) සමහර වෙන්කරගැනීම් ඉතාම විශේෂ වන්නේය." **ඒ කාලයේදී ස්වාමින් වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනයන පිණිසද, අද දක්වා කරන ලෙස ස්වාමින්වහන්සේට සේවය කිරීමට උන්වහන්සේ ඉදිරියෙහි සිටින පිණිසද, ස්වාමින් වහන්සේ ලෙවීගේ ගෝත්‍රය වෙන්කළ සේක."** (ද්වතියකතාව 10 ඃ 8) සමහර අයව උන්වහන්සේ ඉදිරියේ සිටීමට පමණක් වෙන්කර ගෙන ඇත. **"රාත්‍රී භාගයේ ස්වාමීන්ගේ ගෘහයෙහි සිටින්නාවූ, ස්වාමීන්ගේ සියළු මෙහෙකරුවෙනි, ස්වාමීන්ට ප්‍රශංසා කරව්." (ගීතාවලිය 134 ඃ 1) දෙවියන් වහන්සේ දිළිඳුන්ට කන් දෙනසේක. "මක්නිසාද ස්වාමීන් වහන්සේ දිළිඳුන්ට කන්දෙන සේක. තමන් හිරකාරයන් සුළුකොට නොසිතන සේක."** (ගීතාවලිය 69 ඃ 33) ආත්මිකව හෝ ලෞකිකව දේවදරුවන් (වෙන්කර ගනු ලැබුවාවූ අය) වෙනුවෙන් යමක් කරනවිට එම පුද්ගලයා එය කරන්නේ දෙවියන් වහන්සේට වන්නේය. (මතෙව් 25 ඃ 40) උන්වහන්සේගේ නාමයෙන් ආශීර්වාද කරන පිණිස වෙන්කරගෙන තිබෙන සේක."**අම්රාම්ගේ පුත්‍රයෝ නම් ආරොන් සහ මෝසෙස්ය. ආරෝන්ද ඔහුගේ පුත්‍රයෝද ඉතා ශුද්ධ දේ කැපකරන පිණිසත්, ස්වාමින් වහන්සේ ඉදිරියෙහි සුවඳ දුම් ඔප්පු කරන පිණිසත්, උන්වහන්සේට සේවය කරන පිණිසත් , සෑම කල්හීම උන්වහන්සේගේ නාමයෙන් ආශීර්වාද කරන පිණිසත්, හැම කලටම වෙන්කරනු ලැබුවෝය."** (1 ලේකම් 23 ඃ 13) වෙනස් නොවන්නාවූ උන්වහන්සේගේ සේවය උදෙසා වෙන්කරගෙන තිබෙන නිසා දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා.

**"මක්නිසාද සහෝදරයෙනි, නුබළාගේ කැඳවීම, එනම් මාංසය ලෙස ප්‍රඥාවන්ත බොහෝ දෙනෙක්වත්, බලවන්ත බොහෝ දෙනෙක්වත්, වංශවත් බොහෝ දෙනෙක් වත් කැඳවනු නොලැබූ බව බලාපල්ලා."** (1 කොරින්ති 1 ඃ 26) එමෙන්ම අප උදෙසා පිළියෙළ කර තිබෙන දේ මනුෂ්‍යයාගේ කල්පනාවෙන් තේරුම් ගත නොහැකිය. (1 කොරින්ති 2 ඃ 9 - 10) **"එබැවින් නුබළා ඔවුන් අතරෙන් පිටතට ඇවිත් වෙන්ව සිටපල්ලා. අපවිත්‍ර දෙයකට අතනොගසා සිටපල්ලායයි ස්වාමින් වහන්සේ කියනසේක.එවිට මම නුබළා පිළිගෙන නුබළාට පියෙක් වන්නෙමි. නුබළාද මට පුත්‍රයෝත් දුවරුත් වන්නාහුයැයි සර්ව පරාක්‍රම වූ ස්වාමින් වහන්සේ කියනසේක."** (2 කොරින්ති 6 ඃ 17 - 18)

මෙය දෙවියන් වහන්සේ ඔබට දී තිබෙන්නාවූ ආඥාව සහ පොරොන්දුව වන සේක. ඔබ එයට කීකරු වෙනවාද.....? දැන් අපි දෙවියන් වහන්සේගේ ආශීර්වාදය ස්වල්ප වශයෙන් අවබෝධ කරගෙන තිබුනත් යේසුස් වහන්සේගේ නැවත පැමිණීමේදී වචනයෙන් කිවනොහැකි ආශීර්වාදය අපට හිමිකර දෙනු ලබන සේක. (යොහාන් 14 ඃ 3) සදා කාලයටම උන්වහන්සේ සමග සිටින පිණිස වෙන්කරගනු ලබන සේක.

කියාත් ඉගෙන ගන්නෙමු.

ෆැන්සිස් රයිඩ්ලි හාවරගල් විසිනි

**"උත්සහවන්තකමේ දී මැළිනොවෙල්ලා. ආත්මයෙන් ජ්වලිත වෙයල්ලා. ස්වාමින් වහන්සේට සේවය කරපල්ලා." (රෝම 12 ඃ 11)**

2 පිටුවෙන්

# දෙවියන් වහන්සේට...

"ෂඩ්ඩාය" යන වචනයෙන් අදහස් වන්නේ ''අභියෝග කල නොහැකි. සහ පරාජය කල නොහැකි ඬඬ යනුය. ඊළගට අපේ දෙවියන් වහන්සේ වෙනස් නොවන බවත්, හැරීමේ ජායාවක්වත් නොමැති බවත්, උන්වහන්සේට විරුද්ධව සිටින කිසිවෙකුට ජයගත නොහැකි බවත්, අවබෝද කරගත යුතුය. ශක්තිමත් සහ ෂඩ්ඩායි උන්වහන්සේගේ ශක්තයට අභියෝග කල නොහැකි යන ස්වාභාවයෙන් පෙන්වන්නේ සෑම මොහොතකදිම පවතින සියළුම අවශ්‍යතාවයන්වලදී උන්වහන්සේගේ සෙනගව ආරක්‍ෂා කිරීමට සූදානම් සහ ඔවුන්ගේ විරුද්ධ වාදීන්ගෙන් ඔවුන්ව ආරක්‍ෂා කරගැනීමට හැකියාව ඇතිව සිටින බවයි..

කිතුණුවනි, එබඳුව දෙවියන් වහන්සේ අප සමග සිටිද්දී ඔබගේ ජීවිතයේ යහපත් වචනයෙන් ජය ලැබීමට දුෂ්ට මනුෂ්‍යයන්ගේ අවමාන ලෙස හැසිරීම් අවශ්‍ය වන්නේ යැයි සිතන්නේ ඇයි ....? ලෝකයේ සතුට සොයමින් නිදැල්ලේ පැවතීම වර්ධනය වීමට අසහනය සමග සෑමවිටම සම්බන්ද වී සිටින්නේ ඇයි ....? රන්, රිදී, හෝ තමන්ගේම ශක්තිය කෙරෙහි විශ්වාසය තැබීමට සහ නොවටිනා ඕනෑම දෙයක් කෙරෙහි නොසන්සුන්කමින් කල්ගෙවීමට යොමු වී තිබෙන්නේ ඇයි ....? "එල්ෂඩ්ඩායි" නාමය දරණ දෙවියන් වහන්සේ ඔබ සමග සිටිනසේක. ඔබගේ බලය ශුද්ධකම මත වඩා වැඩියෙන් රැඳී තිබීමට ඇදහිල්ලේ බැඳී සිටීම ප්‍රබෝධමත් කරගන්න. එවිට දෙවියන් වහන්සේ සදාකාලයෙන් සදාකාලයට ඔබගේ දෙවියන් වහන්සේ වනසේක. දවස්පතා ඔබට අවශ්‍ය සියළු දේවල දී උන්වහන්සේගේ සැනසිල්ල සැහෙන්නේය. දෙවියන්වහන්සේ ඔබගේ එඬේරා සහ මගපෙන්වන්නා වනවිට පාපයේ ක්‍රියාමාර්ගයන් ඔබ අවබෝධ කරගැනීම කරුණු කොටගෙන නිදැල්ලේ පාපයේ හැසිරීම හෝ අවදානම් ක්‍රියාවලට මුහුණ දීමට සිදුවන්නේ නැත.

උත්පත්ති 17 : 1 වන පදයේ ඊලග වාක්‍යය කෙරෙහි අවධානය යොමුකරන්න. **"මා ඉදිරියෙහි හැසිරෙමින් සම්පූර්ණ වෙයන්න"** සැබෑ ශුද්ධ කමේ ජීවිතයක චරිත ලක්ෂණ වන්නේ දෙවියන් වහන්සේ ඉදිරියේ හැසිරීමයි. කිතුණුවන්ට කරන්නට අවශ්‍යය කාරණාවලට දෙවියන් වහන්සේ කරුණාව සහ ශක්තිය ලබා දෙන සේක. හදවත තුල තබා ගැනීමට දෙන්නා වූ අනුශාසනය වන්නේ.... "මා ඉදිරියෙහි හැසිරෙන්න " කියා වන සේක. එයින් මම දෙවියන් වහන්සේගේ අභිමුකත්වයේ හැසිරීම් අවබෝධ කරන්නෙමි. හරිදේ කිරීමටත්, වැරදි දෙයින් ඉවත්වීමටත්, දෙවියන් වහන්සේගේ කැමැත්තට ගරු කිරීමටත්, ඉගෙන ගන්නෙමි. පුද්ගලික සහ ප්‍රසිද්ධ සියළු ක්‍රියාවන් වලදී දෙවියන් වහන්සේ තුල කටයුතු කිරීමට සැලකිලිමත් වන්නෙමි. **"දුෂ්ටයාගේ ඇස් හමුයේ දෙවියන්වහන්සේට බයක් නැති බව ඔහුගේ අපරාදය මගේ සිතට හගවා දෙයි."** ( ගීතාවලිය 36 : 1 ) නමුත් දෙවියන් වහන්සේගේ මනුෂ්‍යය සැබවින්ම පවිත්‍රව ඔහුගේ ජීවිතයේ සෑම දෙයකදීම ස්වාමින් වහන්සේගේ දිව්‍යමය අභිමුකත්වයේ සිටින්නේය. ඔහු තමන්ගේ ක්‍රියාවන් පිළිබදව කිසි විටෙකත් නිදිබර නොවී සැමවිටම ඒවා අවබෝධ කරගනිමින් පිළියෙළ කරගන්නේය. දේවදරුවන් නිතරම දෙවියන් වහන්සේගේ අභිමුකත්වයේ සිටින නිසා සීමාවන් ඉක්මවා යන අවදානම් ක්‍රියාවල යෙදෙන්නේ නැත.

පාපය නිසා සැමවිටම දෙවියන් වහන්සේගේ අභිමුකත්වයෙන් අතට යන්නේය. දෙවියන් වහන්සේ සමග ශුද්ධ වූ සමීප සම්බන්ධතාවය උන්වහන්සේ මනුෂ්‍යය තුල හටගැනීමට සලස්වන සේක. ඔබ බොහෝ සෙයින් දෙවියන් වහන්සේ ගැන සිතන්නේ නම්, උන්වහන්සේගේ ක්‍රියා මෙන්හි කරන්නේ නම් දෙවියන් වහන්සේ ගැන සිතන්නේ නම්, උන්වහන්සේගේ ක්‍රියා මෙනෙහි කරන්නේ නම්, උන්වහන්සේට ප්‍රශංසා කරමින් යාච්ඥා කරන්නේ නම්, ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොට ගෙන උන්වහන්සේ ඔබ සමග සිටින්නේ නම්, නිශ්චිතවම උන්වහන්සේගේ අභිප්‍රය සම්පුර්ණ කිරීමට කැපවෙනවා ඇත.

3 පිටුවෙන්

# ශුද්ධකමට පිබිදීමේ...

විනෝදය සදහා යොමුවීමෙන් වෙන්ව, එවැනි දේවලට යෙදවීමට කාලය නොමැති බව අවබෝධ කරගෙන අප වටා සිටින ඒ මනුෂ්‍යයන් අහිංසක වුවත් අපි අපගේ ඇදුම් අපවිත්‍රකර නොගැනීම තුල රැඳී සිටිය යුතුය. යාච්ඥා කිරීම සදහා අපගේ අතිශය කැමත්ත තුල ඇති තියුණු මුවනත පවත්වාගෙන ය යුතුය.

එමෙන්ම මේ කාලයේදී වරදට ආකර්ෂනය කරගන්නාවූ දේවලට විරුද්ධ ව ආරක්‍ෂා වී සිටින පිණිස දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇතුව සිටිය යුතුය. දෙවියන් වහන්සේ සමග සමීප සම්බන්ධතාවය පවත්වා ගැනීමෙන් පමණක් ලෝකය සමග කටයුතු කිරීමට හැකිය. ලෝකයේ නවකථා සාහිත්‍යයන් බයිබලය සමග එකට ගැළපීමට උත්සාහ නොකරන්න. ස්වාමීන් වහන්සේගේ කුසලානයෙන් සහ යක්‍ෂයාගේ කුසලානයෙන් යන දෙකෙන්ම පනය නොකරන්න (කොරින්ති 10 : 21) දෙවිවරු දෙදෙනකුට නමස්කාර නොකරන්න. ආගමික ධර්මතාවයන් දෙකක් තුල සතුලු නොවන්න. පූජාසන දෙකක් ඉදිරියේ දණනැමීමෙන් වළකින්න.

අපගේ පරණ ජීවිතයේ සියළු ස්වාභාවයන්ට විරුද්ධව සිට ආරක්ෂා වෙමු. අලසකම, නොරිස්සුම් ගතිය, ඇල්මැරුණු බව, ප්‍රචණ්ඩකම, ගිජුකම (තදආශාව) ගරුසරු නැතිකම, තමා ගැනම උද්ධච්චකම, උඩගුකම, ප්‍රායෝගකාරකම් (කපටිකම), හිතුවක්කාරකම්, අප්‍රසන්නකම, කැතකථාව (නොහෙබනා විහිළු) අනුවණකම්, එලෙස ආරක්ෂා විය යුතු ස්වාභාවයන් කිහිපයකි. ඒ අතරම පහතින් සදහන් වෙන ස්වභාවයන් අපගේ ජීවිතවල වැඩි දියුණු කරගැනීමට (වගාකරගැනිමට) යොමුවෙමු. මෘදු,මොලොක් හෘදය සාක්ෂිය වර්ධනය කරගන්න. පැරණි මතිමතාන්තර (අදහස්) සහ උද්ධච්චකම් වලින් ගැළවෙන්න. ඒ අතරම කුඩා පාපවලට විරුද්ධව අධිකාරී බලය ඇතිව බලා සිටිමින්, කුඩා පාපවල ක්‍රියාවන් අත්හරින්න.
ඒවාට වැය කරන කාලයෙන් මිදෙන්න. එමෙන්ම කඩිමුඩියෙන් ක්‍රියා නොකරන්න. සන්සුන්ව, පිබිදුනු ස්වභාවය ඇතිව අවංකව, සතුටින් කාරුණික (ප්‍රසන්න) ත්‍යාගශීලී සහ අනිත් අය ගැන සිතන කෙනෙක් වන පිණිස කඩිසර වෙන්න. මේ කාරණා සැලකූවිට ඉතා වැදගත් කරුණු වලින් අපි ලෝකයට විරුද්ධවීම් මත සිටිය යුතුය. ලෝකයේ අසතුටුදායක (උදාසීන) කාරණාවලට යන්තමින්වත් එකග නොවී සිටීමට අපි උත්සාහ කරමු. සැමවිටම අපට මුණගැසෙන අයට ප්‍රේමකරමු. කෙසේ වෙතත් ආගමික විරෝධීව සිටින, සෙනෙහස දැක්විය නොහැකි, විශේෂයෙන් පිළිකුල් සහගත ආත්මයක් ඇති අයගෙන් ගැලවෙන්න.

## දෙවියන් වහන්සේගේ සැබෑ පුරුෂයා සහ ස්ත්‍රීය

කිස්තුස් යේසුස් වහන්සේගේ ගෝලයන් වූ අපෝස්තුළුවරු මෙන් අපගේ ගෝලත්වය සම්පූර්ණ කිරීමට සහ නොකඩවා පවත්වාගෙන යමින් උන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය අනුකූලව පවතින බව ඒ තුළින් ප්‍රකාශ වීමට ඉඩහරිමු. අපගේ ජීවිතය සම්පූර්ණ වන බවටත්, අපගේ සියලූම ගමන් කිරීම් අවංකව, කාරුණිකව, යහපත්කමින්, යුතුව තිබෙන බවත් විශ්වාසය ඇති ව සිටිමු. ක්‍රිස්තුස් වහන්සේගේ සත්‍ය තාවයෙන් පාපයෙන් මුදාගෙන අපට නිදහස ලබාදෙනසේක. උන් වහන්සේගේ ප්‍රඥාවෙන් පවිත්‍රකර, ප්‍රාණවත් (උද්යෝගීමත්) කරනසේක. ශුද්ධකම රහිතව නිදහස පිළිගැනීම ගැනත්, පවිත්‍රත්වය නැතිව ප්‍රඥාව පිළිගැනීම ගැනත්, අඛණ්ඩව කැපවීමේ ප්‍රයත්නයක් සහ ප්‍රේමය නැතිව පැමිණෙන සමාදානය පිළිගැනීම ගැනත් ප්‍රවේශම් වෙන්න.

සැබෑ වූ මනුෂ්‍යයාව හොඳින්ම අවබෝධ කරගත හැකි වන්නේ ද වචන තුලින්ය. අපගේ අවංක වීමට, අපගේ නව උත්පාදන සහ අපගේ අළුත් නාමය නිවැරදිවීමට දෙවියන් වහන්සේගේ සභාව අවංක වීමට සැබෑලෙස ආත්මයාණන් වහන්සේ වාසය කිරීමට, ක්‍රිස්තුස් වහන්සේට සහ උන්වහන්සේගේ සත්‍යතාවය ට අවංකව සැලකිල්ලට දැක්වීමට අවශ්‍ය නිවැරදි කාරණා උන් වහන්සේ දේව වචනය තුල ඇතුලත් කර තිබෙනසේක. සත්‍යතාවයට අවංක වීමට එයට ප්‍රේමකිරීමට ඉඩලබා දෙමු. එය ප්‍රසන්න, දර්ශනීය (ප්‍රාණවත්) හෝ ඓතිහාසික නිසා නොව දේව වචනය සහ දිව්‍යමය නිසා දේව වචනයට ප්‍රේම කරමු. එයින් පෝෂණය වීමට දවස් පතා ඊට ඇති ආශාව වැඩි දියුණු කර ගනිමු. දේව වචනයට කිසිවක් එකතු කිරීමට අපට නොහැකිය. නමුත් අපගේ ජීවිත වලට බොහෝ දේ එකතු කිරීමටත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දැනගැනීම සහ කරුණාව තුළ බොහෝ දේ අපගේ ජීවිතවල වර්ධනය කිරීමටත් දේව වචනයට හැකිව තිබෙන සේක.

අපගේ අසාත්මික තත්ත්වය ශක්තිමත් කිරීම අවශ්‍ය ව තිබේ. අපි ශක්තිමත්ව සිටිය යුතු වන්නේ සටන් කිරීමේ දී හෝ වැඩ කිරීමේදී පමණක් නොවේ. තහවුරු කරගනු ලබන වසංගත කාලවලදී ඊට විරුද්ධව ද ශක්තිමත් ව සිටිය යුතුය. එමෙන්ම මේ ලෝකයේ දෙවියාගේ විෂට විරුද්ධව ද ශක්තිමත්ව සිටිය යුතුය.**"පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යාවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් කියා කරන්නා වූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත් ඒවායේ හැසුරුණුය."** (එපීස 2 : 2) මේ ලෝකයේ දෙවියාගේ බලය අප සිටින්නාවූ වාතාවරණය තුල සම්පූර්ණයෙන් ම ව්‍යාප්ත ව පවතින්නේ ය.මෙහිදී ශක්තිමත් වීම සඳහා අපට දැඩි ආහාර පමණක් අවශ්‍ය බව අපෝස්තුළු වරයා කරුණු කොටගෙන නිර්දේශ නොකරන සේක. (හෙබ්‍රෙව් 5 : 12-14) නමුත් උද්යෝගීමත් නැවුම් වූ ප්‍රතිඵල ලබා ගැනීමට නම් සිටින්නා වූ තත්ත්වයෙන් වෙනස් වීමක් දුෂ්කරතාවයක් තුලින් ගමන් කිරීමෙන් සිදුවිය යුතුය. ආත්මයාණන් වහන්සේගේ ප්‍රබෝධමත් කිරීමේ (පිබිදිමේ) දැත්මත අපගේ ජීවිත තබමු. උන්වහන්සේ අපගේ ජීවිත විවිධත්වය, ඵලදැරීම, සෞඛ්‍ය සම්පන්න ජීවිතය තුල පූර්ණකරන සේක. සාතන් අප තුල කොපමණ ශක්ති සම්පන්නව බලය පතුරවමින් සිටියත් දෙවියන් වහන්සේගේ සර්වබලධාරිත්වය කරුණු කොටගෙන අපව එයින් ගළවා ගන්නා සේක. මනුෂ්‍යයාට තමාගේ කැමැත්ත මත වඩා බලවත් ලෙස රැඳී සිටීම සඳහා ශක්තියක් වීමට දර්ශන විද්‍යාවට, තර්ක ශාස්ත්‍රයට, කාව්‍ය ශාස්ත්‍රයට, චතුර කතිකත්වයට පුළුවන. නමුත් ශුද්ධවූ තැනැත්වහන්සේට පමණක් අපව ශුද්ධ කමට පැමිණවීමට හැකියාව තිබෙන සේක.

## ලෝකය තුළ ආලෝකයක් ලෙස දැල්වෙමු

ලෝකයට ආලෝකයක්වීමේ කාරණා තුල වේගවත් වන අතරම සන්සුන්ව (නොකැළ බී) සිටිය යුතුය. කිතුනු ජීවිතය ශක්තිමත්, බලවත් සහ නොකැළඹුණු දීප්තිමත් එකකි. එම දීප්තිය සෑම අංශයකින්ම සම්පූර්ණ සූර්‍යයාගේ දීප්තිය මෙන් පිරිසිදුය. එම නිසා යේසුස් වහන්සේගේ ආලෝකය ලෝකයා වෙතට විහිදුවීම පිණිස අපගේ ක්‍රියාමාර්ග වලදී එම ආලෝකය සෙවිය යුතුය.

ආලෝකය විහිදුවීමේ දි අප සූර්යියා නොව තරු මෙන්වන්නෙමු. නමුත් ක්‍රමක්‍රමයෙන් ආලෝකය අඩු වෙමින් නිවීයන්නා වූ උල්කාපාතයක් ද නොවන්න. අපගේ ආලෝකය විහිදුවමු. සමහරවිට අපතුලින් විහිදුවන ආලෝකය සිහින් විය හැකිය. නමුත් එය පිළිබඳ නිශ්චිතවම සහ පවිත්‍රව මනුෂ්‍යයාට මෙලෙස පැවැසිය හැකි විය යුතුය. රාත්‍රියේදී පැකිලි නොවැටෙන පිණිස ඒය ප්‍රාමණවත්ව තිබේ. දවාල වෙතට ගෙන ඒමට එය ප්‍රමාණවත් තිබේ. පාපයේ මාර්ගයෙන් නිවැරදි මාර්ගයට ගෙන ඒමට මගපෙන්වීම ලබාදීමට එය ප්‍රමාණවත්ව නැත. නමුත් මුළු ලෝකයටම ආලෝකය ලබා දීමට ඒ ප්‍රමාණවත් නැත. සූර්යියාට පමණක් එය කළ හැකිය. තරුවලින් පෙනෙන්නේ ඒවායේ ස්වාභාවික ආලෝකයයි. එබැවින් අප තුල ඇති අතපසුවීම් ප්‍රකාශ විය හැකිය. සූර්‍යයාගේ මහත් වූ ආලෝකය පැමිණ විට උණුසුම සහ සියළු දේවල් සම්පූර්ණයෙන්ම ප්‍රකාශ වන්නේ ය.**"රාත්‍රිය බොහෝසේ ඉකුත්ව ගියේ ය. දවාල ළගය. එබැවින් අන්ධකාරයේ ක්‍රියා අහකදමා ආලෝකයේ ආයුධ පැළඳ ගනිමු"** ( රෝම 13 : 2 )

අපගේ ඉර බැසයන්නේවත් වලාකුළුවලින් වැසීයන්නේවත් නැත. අපගේ ආලෝකය අහිමි වී තිබේ නම්, අපගේ ජීවිත වල ආලෝකය නොමැතිවීම ගැන අමනාප නොවී සදාකාලිකවම පවතින්නාවූ සූර්යියා වන යේසුස් වහන්සේ වෙතින් එම ආලෝකය ලබා ගන්නා පිණිස උන්වහන්සේ වෙතට කැඳවනු ලබන සේක. උන්වහන්සේ අපගේ ආලෝකය විහිදුවීම වර්ධනය කරන සේක.**"මනමාලි ඇත්තා මනමාලයාය. නමුත් මනමාලයා ළඟ සිට ඔහුගේ වචන අසන ඔහුගේ මිත්‍රයා මාලයාගේ හඬට බොහෝ සෙයින් ප්‍රීතිවෙයි. එබැවින් මාගේ මේ ප්‍රීතිය සම්පූර්ණ වී තිබේ"** යේසුස් වහන්සේගේ ශුද්ධකමේ ආලෝකය අප තුළින්ද විහිදු වන සේක. ( එළිදරව් 4 : 8 )

# පුද්ගලිකව යාච්ඤා කිරීම

**"නමුත් නුඹ යාච්ඤා කරන කල්හී නුඹේ ඇතුල්ගෙට වැද දොර වසා, රහසිගතව වසන නුඹේ පියාණන් වහන්සේට යාච්ඤා කර පන්න. එවිට රහසින් දකින නුඹේ පියාණන් වහන්සේ නුඹට විපාක දෙනසේක"**( මතෙව් 6 : 6 )

පුද්ගලික යාච්ඤාව අපගේ අවංකකම සොදිසි කිරමකි. අපගේ ආත්මික ජිවිතයේ තත්වය එයින් ප්‍රකාශ වේ. ප්‍රතිපත්තිමය වශයෙන් පුද්ගලික යාච්ඤා කරුණාව තුල වර්දනය වීමේ වත්කමයි. අපිව කොපමණ එම වගම්ක අතපසු කර කණගාටුදායක ලෙස එම කාර්යය ඉටුකිරීමෙහි අසර්තකව සිටිනවාද....? බොහෝ අවස්ථවලදී අප අතරින් සමහර අය දෙවියන් වහන්ස්ගේ හඬට ඇහුම්කන් දෙන්නේ නැත.**"එබැවින් සේනාවල ස්වාමින් වහන්සේ මෙසේ කියන සේක. නුබළාගේ මාර්ග සිතට ගනිල්ලා. නුබළා බොහොම වැපුරූ නමුත් එකතුකර ගත්තේ ස්වල්පයක්ය. නුබළා කන නමුත් තෘප්තියට නොපැමිණෙන්නහුය. බොන නමුත් සෑහීමට නොපැමිණෙන්නහුය . අඳින නමුත් උණුහුම් නොවන්නහුය. කුලී ලබාගන්නද එය ලබාගන්නේ හිල් ඇති පසුම්බියකට දමන්ටය. සේනාවල ස්වාමින් වහන්සේ මෙසේ කියන සේක. නුබළාගේ මාර්ග සිතට ගනිල්ලා."** (හග්ගයි 1 : 5 - 7) පසුගිය කාලයේ පුද්ගලික යාච්ඤා කිරීමෙහි තිබු අසාර්ථකවීම පිළිබඳව වර්තමානයේ කනගාටුදායක ලෙස නැවත පුන පුනා තහවුරු වී ප්‍රකාශ වෙනවාද....? දෙවියන් වහන්සේගේ ආශිර්වාදය අපගේ ආත්මවලට ලැබෙන පිණිස උන්වහන්සේ සමග සහභාගීත්වයත්, උන්වහන්සේගේ අපේක්ෂාවත් නොකඩවා පවත්වාගෙන යාමට පුළුවන්ද.....? දෙවියන් වහන්සේගේ රහස්ථානයවූ ඉතා උසස් ස්ථානයේ ඇති සමාදානයේ සහ ප්‍රීතිය දකිමු. ශක්තිය අළුත් කර ගැනීමටත් ඇදහිල්ලේ උද්යෝගීමත් කරගැනීමටත්, කරුණාව යලි අළුත්විමටත් ඇතුල්ගෙට වැද පුද්ගලිකව යාච්ඤා කරමු.

පුද්ගලික යාච්ඤාවට ඇති දැඩි සැලකිල්ලට හෝ සතුට මේ ලෝකයේ කාරණා සෑමවිටම බාද්‍ර කරන්නේ නැත. ප්‍රසිද්ධියේ අපට ඉටුකිරීමට ඇති වගකීම නිසා පුද්ගලිකව යාච්ඤා කිරීමට සමහර විට ඒවා බාධාවීමට ඉඩහැර ඇත. ප්‍රිය මිත්‍රවරුණි, එක් රැස්වීමකින් පසු තවත් රැස්වීමකට දුවන පිණිස කාර්ය බහුලවීම ගැන සැලකිලිමත් වෙන්න. සෙනගව පිටත්කර හැර දෙවියන් වහන්සේ සමග පුද්ගලිකව සම්බන්ධතාවය පවත්වාගන්න. සමහර අය දේශනා පිළියෙල කරගැනීම සඳහා කියවීම තුල කාර්යබහුලවිම නිසා දෙවියන් වහන්සේ සමග පුද්ගලික සම්බන්ධතාවය පවත්වාගැනීම අවහිර වී ඇත. අනිත් සියල්ලට වඩා වැඩියෙන් පුද්ගලික යාච්ඤා කිරීම වැළැක්වීමට සාතන් සොයමින් සිටිති. මක්නිසාද කිතුණුවන්ගේ පුද්ගලික යාච්ඤා කිරීමට බාද්‍රකර එය වළක්වා සාර්ථක වුවහොත් අනිත් සියළු දේවලදී කිතුණුවන් අසාර්ථක වන බව සාතන් හොදින්ම දැනසිටිති.

පරණ ගිවිසුම සහ අළුත් ගිවිසුම කාලයේ ඉතා විශිෂ්ඨවූ ශුද්ධවන්තයන් පුද්ගලිකව යාච්ඤා කිරීමට ඔවුන්ගේ ජිවිත යෙදෙව්වෝය, **"ආබ්‍රහම් බෙයර්ෂෙබාහි එෂෙල් ගසක් සිටුවා එතැන් හී සදකාල දෙවිවූ ස්වාමින් වහන්සේගේ නාමය කියා යාච්ඤා කළේය....."(උත්පත්ති 21 : 33) "ඊසාක් සවස් වේලෙහි කෙතේ මෙනෙහි කරන පිණිස ගියේය. තවද ඔහු ඇස් ඔසවා බලා ඔටුවන් එනවා දුටුවේය."** (උත්පත්ති 24 : 63) යාච්ඤා කිරීම සදහා "මෙනෙහි කිරීම" යන වචනයත් හෙබ්‍රෙව් භාෂාවේ වැදගත්ව තිබේ. තවත් ස්ථානයක යාච්ඤා කිරීම සහ රහසින් කථාකිරීම ලෙස පරිවර්තනය කර ඇත. එමනිසා යාකොබ්, මෝසෙස්, සාමුවෙල්, දාවිත්, එළියා, හෙසකියා ආදී මනුෂ්‍යයන් පුද්ගලිකව මෙනෙහි කිරීමෙහි යෙදුන බව ශුද්ධ ලියවිල්ලෙහි සදහන්ව තිබේ. දානියෙල් පිළිබඳව අපි කියවන්නාවූ සත්‍යතාවය දෙස සැලකිල්ලෙන් බලන්න. **"ඒ පත්‍රය අත්සන් කලබව දානියෙල් දැනගත්විට තමාගේ ගෙදරට ගොස් තමාගේ උඩුමහලේ කවුළු යෙරුසලම දෙසට ඇරී තිබියදී තම ඊට පළමු කළාමෙන් දවසට තුන්වරක් දණින් හිඳ තමාගේ දෙවියන් වහන්සේ ඉදිරියෙහි යාච්ඤා කොට ස්තුති කළේය."** (දානියෙල් 6 : 10) ඔහු කාර්යීය බහුලව සිටියත් ප්‍රසිද්ධියේ ඔහුට පැවරී තිබු කාර්යීයන් පුද්ගලික මෙනෙහි කිරීමට පීඩනයක් වීමට ඉඩහැරියේ නැත.

ක්‍රිස්තුස් වහන්සේ පොළොවේ මනුෂ්‍යයෙක් ලෙස ජිවත් වූ කාලයේදී උන්වහන්සේ පුද්ගලික යාච්ඤා කිරීමෙහි යෙදීසිටි සේක. පහත සදහන් බයිබල් පද සැලකිල්ලට ගෙන බලන්න. (මතෙව් 14 : 23, මාර්ක් 1 : 35, 6 : 46, ලූක් 5 : 16) එම පදවල උන්වහන්සේ යාච්ඤා කරන පිණිස අනිත් අයගෙන් වෙන්ව "කන්දට ගිය බව" "වනාන්තරයට ගිය බව" සදහන්ව තිබේ. එහිදී යේසුස් වහන්සේට නිදහසේ, බාද්‍රවාක් නැතිව, අවදානය නොබිදී පියාණන් වහන්සේ සමග තනිවීමට හැකි වූ සේක.

සැබෑ කිතුණුවන් තමන්ගේ යාච්ඤා ජිවිතයේ හෘදය සාක්ෂිය පිළියෙළ කරගනිමින් දෙවියන් වහන්සේ බල සිටින බවත්, පුද්ගලිකවම තමන්ට ඇහුම්කන්දී සිටින බවත්, අවබෝධ කරගෙන උන්වහන්සේ සමග පුද්ගලික සම්බන්දතාවය වර්ධනය කරගනිති. උද්යෝගීමත්ව අපගේ පුද්ගලික මෙනෙහි කිරීමෙහි නියැලෙමු. එය අපගේ අවංකකමේ මිණුම් දණ්ඩයි.

## පියාණන් වහන්සේගේ ආශිර්වාදය

යම් කෙනෙක් දෙවියන් වහන්සේ ඉදිරියෙහි රහසින් (පුද්ගලිකව) සිටීමෙන්, නිතරම උන්වහන්සේ සමග සම්බන්ධතාවය ඇතුව පවතිනවිට උන්වහන්සේගේ අනර්ඝවූ දීමනාවන් ලබාදෙන බව සදහන්කර තිබෙනසේක. සර්වබලධාරී දෙවියන් වහන්සේ සමග මෝසෙස් කන්දේ සිටින විට උන්වහන්සේ ඔහුට ව්‍යවස්ථාව ලබාදුන්සේක. නැවත ඔහු එසේ උන්වහන්සේ සමග සිටින විට සම්මබවීමේ කූඩාරම සෑදීමේ ආකෘතිය ඔහුට ලබාදුන්සේක. දනියෙල් පුද්ගලික යාච්ඤා කිරීම තුල නිරතව සිටි අතර දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ස්වර්ගීය දූතයන්ව දනියෙල් වෙතට එවමින් යෙරුසලම නැවත ගොඩනැගීම සහ මෙසියස් වහන්සේගේ කාලය පැවතීම පිළිබඳව උන්වහන්සේගේ උපදෙස් අනාවරණ කලසේක. (දනියෙල් 9 : 3, 21-27) ඔහු කරුණාවේ සිංහාසනය ඉදිරියෙ තනිව රැදී සිටින කාලය අතරතුර නිසැකකම ඔහු තුල ඇතිකල සේක.**"ඔහු මට කථාකොට, බොහෝ ප්‍රේමලත් මනුෂ්‍යයා වූ දනියෙල්, මා විසින් නුඹට කියන වචන කල්පනාකර නැගිට කෙලින් සිටපන්න......" (දනියෙල් 10:11) "ඔහු මට කථාකොට, බොහෝ ප්‍රේමලත් මනුෂ්‍යය භයනොවන්න. නුඹට සමාදානය වේවා. සවි වෙයන්න, සවි වෙයන්නැයි කිවේය....."** (දනියෙල් 10 : 19) පුද්ගලික යාච්ඤාවේ රහස තුල දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ආදරයේ සහ තෝරාගැනීමේ ආශිර්වාද ලබාදීම සාමාන්‍ය දෙයක්ව තිබේ. කොරනේලියස් ඔහුගේ පුදගලික යාච්ඤාව තුල උසස්වූ නියෝගයක් සහ කරුණාවන්තවු ප්‍රතිඵලයක් හිමිකරගත්තේය. (ක්‍රියා 10 : 1 - 4) ප්‍රේතුස් අනිත් අයගෙන් වෙන්ව සිට යාච්ඤා කරද්දී අන්‍යජාතීන් කෙරෙහි සැලකිල්ල දැක්වීම පිළිබඳව පුදුමු වූ දර්ශනයක් ලබාගත්තේය. (ක්‍රියා 10 : 9 - 13)

පුද්ගලික යාච්ඤාවේ මහත් වූ උදාහරණ සහ සාක්ෂි සහිතව පවතින තහවුරු කිරීමේ ශුද්ධ ලියවිල්ල තුල පැතිරී පවතින්නේය. දෙවියන් වහන්සේ සමග පොරබැඳීමේ රහස අවබෝධ කරගැනීම කොපමණ අනර්ඝද.....? අපට ලබාදී තිබෙන්නාවූ උන්වහන්සේගේ කරුණාව කොපමණ විශිෂ්ඨද.....? විනිශ්චය ආපසු හරවා මුද්‍රගනිමින් රැකවල් කරනසේක. ඊසාක් යහපත් භාර්යීාවක් වෙනුවෙන් දෙවියන් වහන්සේ සමග තනි වී උන්වහන්සේට ආයාචනා කරන විට ඔහුට රෙබෙකා මුණ ගැසුණාය. (උත්පත්ති 24 : 63 - 64) හෙසකිය රජතුමා කඳුළු සලමින් පුද්ගලිකව යාච්ඤා කරනවිට දෙවියන් වහන්සේ යෙසායා අනාගතවකතෘව නැවත හරවා

> **ආර්තර් ඩබ්. පින්ක් විසිනි**

යවමින් හෙසකියාගේ වයසට තවත් අවුරුදු පහළොවක් එකතු කල බව සහතික කලසේක. ( යෙසායා 38 : 5 ) යෝනා මත්සයාගේ බඩේ සිටිද්දී කළාවූ ඔහුගේ අයැදීමට පිළිතුරු ලෙස ඉන් මිදීම ලැබුවාය. ( යෝනා 2 : 1 - 10 ) පුද්ගලික යාච්ඤා කිරීම කොපමණ බලවත්ව තිබෙනවද......? ඒ තුලින් මරණයට පත්ව සිටියවුන් නැවත ජිවනයට පැමිණවීමටත් හැකි වුයේය.( 1 රාජාවලිය 17 : 18 - 22 , 2 රාජාවලිය 4 : 32 - 35 ) උද්යෝගිමත්ව පුද්ගලික යාච්ඤාවෙන් අනිත් අය උදෙසා ආයාචනා කරන විට ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේගේ කරුණාව කරුණුකොටගෙන අපව පාවිච්චි කරන සේක.

## සෑම දවසක්ම දෙවියන් වහන්සේ සමග ආරම්භ කරන්න.

**"ස්වාමිනී......, උදය වේලෙහි ඔබ මාගේ හඬ අසන සේක. උදය වේලෙහි ඔබට මාගේ යාච්ඤා පිළියෙළ කොට බලාසිටින්නේ නෙමි."** (ගීතාවලිය 5 : 3) මෙය අපගේ අධිෂ්ඨානය කරගෙන එය අපගේ ජිවිතයේ ව්‍යාප්ත කරගනිමින් සැමදාම ප්‍රායෝගිකව එහි පවතිමු. අපගේ කාර්යය සැමදාම දෙවියන් වහන්සේ සමග ආරම්භ කරමු.**"ඔවුහු කේඳිරිගාන්නාවූ, තොල් මතුරන්නාවූ, ආත්ම බන්ධනකාරයන්ගෙන්ද, අණවිනකාරයන්ගෙන්ද, විභාග කරපල්ලායයි නුබළාට කියන විට සෙනගක් විසින් ස්වකිය දෙවියන් වහන්සේගෙන් විභාග කරන්නට යුතු නොවේද....?"** (යෙසායා 8 : 19) කියා දෙවියන් වහන්සේ අපෙන් අසන සේක.**"මාගේ මුහුණ සොයන්න"** කියා දෙවියන් වහන්සේ අපට පවසන සේක. ඒ සදහා අපගේ හදවත්වල පිළිතුර මෙය නොවන්නේද....? **"මාගේ මුහුණ සොයව්යයි ඔබ කී කල, ස්වාමිනි, ඔබගේ මුහුණ සොයන්නෙමියි මාගේ සිත ඔබට කිය"** (ගීතාවලිය 27 : 8) නමුත් අපගේ හදවත් උදසිනවී, නපුරට ගොදුරු වී දෙවියන් වහන්සේගේ මාර්ගයෙන් මුලාව ගොස් ඇත. එසේ වුවත් උන්වහන්සේ අපට මෙසේ පවසන සේක. **"අභක්ව ගියාවූ දරුවෙනි, හැරීවරෙල්ලා මම නුබළාගේ පසුබට වීම් සුවකරන්නෙමි. මෙන්න අපි ඔබ වෙතට ඇවිත් සිටිමුව. මක්නිසාද ස්වාමින් වහන්ස ඔබම අපේ දෙවියන් වහන්සේය."** (යෙරමියා 3 : 22)

ප්‍රිය මිත්‍රවරුණි, අපේ දෙවිවූ ස්වාමින් වහන්සේට තවදුරටත් එලෙස පැවසීමට ඉඩ නොහැර උන්වහන්සේ සහ අප අතර ඇති සම්බන්ධතාවය කොපමණ වැදගත්ව තිබෙනවා දැයි සැලකිල්ලෙන් යුතුව අවධානය යොමු කරමු. අපි අපේක්ෂා කරන්නාවූ සියළු දේ උදෙසා අපි නිශ්චිතවම උන්වහන්සේ මත රැදී සිටිය යුතුය. අපගේ සතුට වෙනුවෙන් කාලය වැය නොකර සදකාලික වූ දෙවියන් වහන්සේගේ කැමත්ත වෙතට යොමුවෙමු. අපි උන්වහන්සේගේ කැමැත්ත පරික්ෂා කිරීම අවශ්‍යය නැත. නමුත් අපේ මුළු හදවතින්ම උන්වහන්සේව සොයමු. අපගේ බොහෝ වූ සහ බේදජනක පාප කරුණු කොටගෙන එහි ප්‍රතිඵලය අනුව කෙලෙසීමට බැදී සිටීම කරුණු කොටගෙන අපගේ දෙවිවූ ස්වාමීන් වහන්සේව ගැඹුරින් වේදනාවට පත්කිරීම පිළිබඳව මනා වැටහීමක් නැතිව සිටිනවාද......? වරද පිළිගෙන පසුතැවිලි නොවීමේ අනුවණකම සහ යේසුස් වහන්සේගේ ලේ කරුණු කොටගෙන පවිත්‍රවිම සහ සමාව ලබාගැනීම වෙතට යොමුනොවී සිටිනවාද.....? උන්වහන්සේගේ අසීමිත ආශීර්වද සහ කරුණාව ලබානොගෙන සහ ඒවා ඒත්තු නොගෙන, නැවත උන්වහන්සේ වෙතට හැරී ස්තුති ප්‍රශංසා නොකර සිටිනවාද......? අපගේ පුද්ගලික යාච්ඤා කිරීම පවතින්නේ ඉතා සුළු වශයෙන්ද....? දෙවියන් වහන්සේ වෙතට හැරී උද්යෝගයෙන් යුතුව උන්වහන්සේ සමග පුද්ගලික සම්බන්දතාවය පවත්වාගන්න.

**"මා නුඹලා ළගට එන කල ක්‍රිස්තුස් වහන්සේගේ ආශිර්වාදයේ පූර්ණත්වය ඇතුව මා එන බව දනිමි." (රෝම 15 : 29)**

Reg. No: QD/NEWS/15/2022
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



# නව වර්ෂය සඳහා ශක්තිය

**(ජේ.ආර්.මිලර් විසිනි )**

දෙවියන් වහන්සේ අපට ශක්තිය ලබාදී තිබෙන සේක. උන්වහන්සේගේ ශක්තිය අප වෙතට පැමිණෙන්නේ කෙසේද......? එය විවිධවූ මාර්ග වලින් අප වෙතට පැමිණෙයි. ආලෝකයේ පියාණන් වහන්සේ වෙතින් සියළු යහපත් සහ සම්පූර්ණ වූ දේ පැමිණෙන බව යාකොබ් පවසන්නේය. (යාකොබ් 1 : 17) දෙවියන් වහන්සේ වෙතින් සැබවින්ම අප වෙතට බලය පැමිණෙන නිසා එය පැමිණෙන්නේ කොහොමදැයි යන්න ප්‍රශ්ණයක් නොවේ. සමහරවිට අපි පොතක් කියවද්දී එහි සදහන්වන දේවලින් උද්යෝගිමත් වීම නිසා අපගේ පොරබැදීමට හෝ සේවයට ප්‍රබෝධයක් ඇතිවිය හැකිය. සමහරවිට මිතුරන්ගේ ඔල්වර හඬ (උනන්දුකිරීම) මිත්‍රත්වය, උපකාරය අපව ධෛර්‍ය්‍යමත් කිරීමට සහ බලාපොරොත්තු ඇති කිරීමට හේතුවිය හැකිය. මනුෂ්‍යන්ගේ ප්‍රේමය තුලින් දෙවියන් වහන්සේ අපට ශක්තිය සහ ආශීර්වාදය ගෙන දෙනබව අපි අවබෝධ කරගත යුතුය. දෙවියන් වහන්සේ මනුෂ්‍යයන්ගේ සෙනෙහස තුල රහසේ රැදී සිටිමින් එම සෙනෙහස තුලින් අපව ස්පර්ශ කරනසේක.මනුෂ්‍යයන්ගේ දෑස් තුලින් දෙවියන් වහන්සේ අපේ දෑස් දෙස බලාසිටින සේක. මනුෂ්‍යයන් කථාකරන වචන තුලින් දෙවියන් වහන්සේට ඇහුම්කන්දීමට සලස්වන සේක. මිතුරන් අප වෙතට පැමිණ දක්වන ප්‍රේමය සහ උද්යෝගිමත් කිරීම තුලින් අපි ක්ලාන්තව සිටින විට දෙවියන් වහන්සේ අපට බලය ලබාදෙන සේක. අපි අධෛර්‍ය්‍යමත්ව සිටින විට අපව ධෛර්‍ය්‍යමත් වන පිණිස දෙවියන් වහන්සේ අපව බලාපොරොත්තු ගෙන දෙන සේක.

අතීත දවස්වල දී දෙවදූතයන් කළා වූ මහත් වූ සේවය පිළිබදව බයිබලයේ අපට පවසා තිබේ. දෙවදූතයන් පැමිණ පිඩාවටපත්ව සිටිය හෝ පොරබදමින් (සටන්වදිමින්) සිටිය අයව ධෛර්‍ය්‍යමත් කරනු ලැබුවෝය. අපගේ ස්වාමීවූ යේසුස් වහන්සේ පරීක්ෂාවෙන් ජය ගත් පසු දෙවදූතයන් පැමිණ උන්වහන්සේට උපස්ථාන කළේය. උන්වහන්සේ ගෙත්සෙමන උයනේ දැඩි වේදනාවට පත්ව සිටින විට දෙවදූතයන් ප්‍රකාශ වී උන්වහන්සේව ශක්තිමත් කළෝය. දැනුත් දෙවදූතයන් පැමිණ අපව ශක්තිමත් කරමින් අපට සේවය කරන බවට සැකයක් නැත.

## දෙවියන් වහන්සේගේ වචනයෙන් ශක්තිය ලබාදෙන සේක.

දෙවියන් වහන්සේ තවත් බොහෝ මාර්ගවලින් ශක්තිය ලබාදෙන සේක. ඒ අතරින් දෙවියන් වහන්සේගේ වචනයෙන් ප්‍රධාන වශයෙන් අපට ශක්තිය ලබදෙන සේක. අපි වේදනාවෙන් සිටින අවස්ථාවලදී අපි අපගේ බයිබලය විවෘත කර කියවන විට දිව්‍යමය ප්‍රේමය සහතික කරනසේක. අපගේ පියවූ දෙවියන් වහන්සේ පොරොන්දු වී තිබෙන දිව්‍යමය උපකාරක සහ සැනසීම සහතික කරනසේක. දෙවියන් වහන්සේගේ දරුවන්ට සියළුමදේම සිදුවන්නේ ඔවුන්ගේම යහපත පිණිස බව සහතික ලෙස පෙන්වා දෙමින් අපගේ වේදනාවන් ආශීර්වාදයට හරවනසේක. අපි කියවන්නාවූ දෙවියන් වහන්සේගේ වචනය අපි විශ්වාස කරනවිට එහි ඇති ආශීර්වාදය අප වෙතට පැමිණ අපගේ අපගේ ආත්මයට අළුත් ශක්තියක්, අපූර්ව වූ නිශ්චලතාවයක්, සමාද්‍රානයේ බලාපොරොත්තුවක් ලබාදෙමින් නැවත අපව සනසනු ලබනසේක.

සමහර දවස්වලදී අපි අධෛර්‍ය්‍යමත්වී, අතිශයින් කැළැඹීමට ලක් වී, වෙහෙසකර බව නිසා කනස්සලට පත් වී, අසහනයට පත්වීම කරුණුකොටගෙන ජීවිතයේ ගමන් කිරීමට බැරි තරම් අවස්ථාවලදී සිත ව්‍යාකුලවී, ක්ලන්තභාවයට පත්ව සිටින විට අපි බයිබලය කියවන්නට පටන් ගැනීමත් සමගම දෙවියන් වහන්සේ අපට කථාකරමින් අපව උද්යෝගිමත් කරනසේක.

**"නුඹළාවෙත, සමාදානය තබායමි. මගේ සමදානය නුඹළාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුබළාගේ සිත් කැලබෙන්ටවත්, භයවෙන්ටත් නොදෙල්ලා"**(යොහාන් 14 : 27) **"භය නොවෙන්න. මක්නිසාද මම නුබ සමග සිටිමි. තැති නොගනින්න. මක්නිසාද මම නුබේ දෙවියන් වහන්සේ ය. මම නුබ ශක්තිමත් කොට, නුබට උපකාර කරන්නෙමි. එසේය මාගේ ධර්මිෂ්ටකම නමැති දකුණතින් නුබ උසුලන්නෙමි"** (යෙසායා 41 : 10) **"නුබේ බර ස්වාමින් පිට තබව. උන්වහන්සේ නුබ උසුලන සේක. උන්වහන්සේ කිසිකලෙකක් ධර්මිශ්ඨයා සෙලවෙන්ට නොදෙන සේක"** (ගීතාවලිය 55 : 22) **"මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණ වෙන්නේ යයි මට කිසේක. එබැවින් කිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිට වන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි".**

(2 කොරින්ති 12 : 9) අපි දේව වචනය කල්පනාකාර බලද්දී අපගේ විඩාව (වෙහෙස) පහව යන්නේය. ශක්තිය ලැබෙනවා අපට හැගෙන්නේය. බලාපොරොත්තුව ප්‍රාණවත් වන අතර ධෛර්යය නැවත ලැබෙන්නේය. යම් කෙනෙක් බයිබලය දෙවියන් වහන්සේගේ වචනය ලෙස කියවන විට එහි පොරොන්දු පරදී දෙවියන් වහන්සේගේ හඩට ඇහුම්කන් දෙනවිට, එහි ඇති සහතිකයෙන්, ආශාවලින්, උපදේශවලින් නොකඩවා ශක්තිය ලැබෙන්නේය.

## දෙවියන් වහන්සේම ශක්තිය ලබාදෙන සේක.

මේ සියළුම දේවලටත් වඩා දෙවියන් වහන්සේම උන්වහන්සේගේ ප්‍රේමය සහ කරුණාව කරුණු කොටගෙන අප තුලට පැමිණ වාසය කරනසේක. අනාගතවකතෘ එය අපට මෙලෙස පවසා තිබේ. "උන්වහන්සේ ක්ලාන්තවූ අයට ශක්තිය දෙනසේක. බලය නැත්තාට සවිය වැඩි කරනසේක." (යෙසාය 40 : 29) මෙහිදී පොළොවේ ඇතිවන වෙහෙස සහ ක්ලන්තභාවයට වෙන කිසිවකින් ලබා ගත නොහැකි දෙවියන් වහන්සේගේ දිව්‍යමය ශක්තිය අදහස් කරනු ලබන්නේය. අපගේ දුර්වලකම්වලදී අපට දී තිබෙන්නාවූ ක්‍රිස්තුස් වහන්සේගේ බලය කරුණුකොටගෙන අපගේ හිස්කම පහකර දමනසෙක.

යම් කෙනෙක් අපගේ ප්‍රශ්නවලදී අප සමීපයේ සිටිමින් අපට දන්නාවූ ඔහුගේ අනුකම්පාවත්, ප්‍රේමයත්, ඔහුගේ ධෛර්‍ය්‍යමත් කිරීමත්, උනන්දුකිරීමක් කරුණු කොට ගෙන අපට කුඩා ශක්තියක්විමට පුළුවන. නමුත් අපගේ හදවතේ ඕනෑම අංශයකට ඔහුගේ ශක්තිය හෝ ප්‍රීතිය ලබාදීමට නොහැකිය. ක්‍රිස්තුස් වහන්සේ අපට ශක්තිය ලබාදීමට උන්වහන්සේගේ ජීවිතය පුජාකළ සේක. මිදීවැලට අතුවෙනුවෙන් වෙන කල හැකි කුමක්ද....? යේසුස් වහන්සේට අප වෙනුවෙන් එලෙසම ක්‍රියා කල හැකිය. අතුවලට වේදනා ඇතිවන විට, තැලීම්, බිදීම් සිදුවන විට, අතු නාස්ති වන විට ඒ ඕනෑම අවස්ථාවකදී මිදීවැලේ ඇති ජීවය තුවාල වූ අතුවලට ගලායන්නට සලස්වමින් අහිමි වූ දේ සහ සුවයත් ලබා දෙන්නේය. ක්‍රිස්තුස් වහන්සේ අප තුල කරන්නේ මොනවාදැයි බලන්න. අපි ක්ලාන්තවූ විට උන්වහන්සේ බලය ලබා දෙනසේක. අපගේ දුර්වලකමේදී උන්වහන්සේගේ ශක්තිය සම්පූර්ණ කරනසේක. ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාව කරුණුකොටගෙන අපගේ අවශ්‍යතාවයන් මහත්ලෙස සපයා දෙන සේක. එබැවින් සෝදිසි කිරීමේ අත්දැකීමට පැමිණෙන තෙක් අපි ආශීර්වාදය ලබාගන්නේ නැත. අපි වේදනාවට මුහුණ දෙන තෙක් දෙවියන් වහන්සේගේ සැනසිල්ල අත්දකින්නේ නැත. දැඩි ශෝකය (කණගාටුව) කුමක්දැයි අපි ඉගෙන ගන්නා විට දෙවියන් වහන්සේ අපට ශක්තිය ලබාදෙන්නේ කොහොමද කියාත්, කනස්සල්ලේදී උන්වහන්සේගේ සැනසිල්ල ලබදෙන්නේ කොහමද කියාත් ඉගෙන ගන්නෙමු.

## වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම වේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත,
මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.